# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සංක්ෂිප්ත ඉතිහාසය

1950 දශකයේ මැද භාගයේදී දේශයේ අවශ්‍යතාවය සඳහා සටන් පිළිබඳ නිපුණත්වයකින් හිමි රෙජිමේන්තුවක අවශ්‍යතාවය මත එවකට පැවති රජය හට යුද්ධ හමුදාවේ සන්නද්ධ බලය වැඩි කිරීමට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1956 ඔක්තෝබර් මස 01 වන දින බ්‍රිතාන්‍ය කොළ කබා රෙජිමේන්තුවේ සම්ප්‍රදායන් සමගින් බිහිවූ ලංකා සිංහ රෙජිමේන්තුව යුද්ධ හමුදාවට එක්විය.

යුද්ධ හමුදා නිත්‍ය බළසේනාවේ ප්‍රථම වරට රයිෆල් රෙජිමේන්තුවක ඓතිහාසික ආරම්භය සනිටුහන් කරමින් 1956 ඔක්තෝබර් මස 01 වන දින දියතලාව ඉම්පීරියල් කඳවුරේදී බිහිවුණු ලංකා සිංහ රෙජිමේන්තුවේ මූලාරම්භක මෙහෙවර සඳහා ලංකා පාබළ හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිලයින් හැට දෙනෙකුගෙන් පමණ යුත් භටපිරිසක් ඇතුළත් වූ අතර, නව බළඇණියේ ප්‍රථම අණදෙන නිලධාරි ලෙසින් ලුතිතන් කර්නල් ආර්ඩී ජයතිලක එම්බීඊ කටයුතු කරන ලදී.

මෙම වකවානුවේදී ලංකා ස්වේච්ඡා පාබළ හමුදාවේ මහනුවර ස්ථානගතව සිටි භට කණ්ඩායම යොදා ගනිමින් වර්ෂ 1956 ඔක්තෝබර් 01 වන දිනම 2 වන (ස්වේච්ඡා) ලංකා සිංහ රෙජිමේන්තුව මහනුවරදී ආරම්භ කරන ලදී.

ඉන්පසු 1969 ඔක්තෝබර් මස 01 වන දින නුවරඑළිය හීල්ස්කූල් හිදී 3 වන (ස්වේච්ඡා) සිංහ බළඇණිය ආරම්භ කරන ලදි. ලංකාව 1972 මැයි මස 22 වන දින බ්‍රිතාන්‍ය කිරීටයෙන් සම්පූර්ණයෙන් නිදහස් වූ ජනරජ දිනයේ දී මෙතෙක් ලංකා සිංහ රෙජිමේන්තුව ලෙසින් හැඳින්වූ මෙම සිංහ බළඇණි ''ශ්‍රී'' අක්ෂරය මුලට යොදා පිළිවෙලින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු (ස්වේච්ඡා) බළඇණි වශයෙනුත් නම් කරන ලදි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බළඇණි සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීමත් සමග එම බළඇණිවල විධිමත් පාලනයක් ඇති කිරීම සඳහා රෙජිමේන්තු සංකල්පය මත 1988 මැයි මස 09 වන දින දියතලාවේදී ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය පිහිටවනු ලැබීය. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ප්‍රථම රෙජිමේන්තු ආඥාපති ලෙස බ්‍රිගේඩියර් ඩී විජේසිංහ පත්වූ අතර රෙජිමේන්තු මධ්‍යස්ථානය 1989 ඔක්තෝබර් මස 21 දින එවකට 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මූලස්ථානය පිහිටුවා තිබූ වත්මන් අඹේපුස්ස කඳවුර තුල ස්ථිරවම ස්ථානගත කරන ලදි.





## ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති තුමාගේ පණිවිඩය

1956 දී ආරම්භ කරන ලද වසර 63 ක ප්‍රෞඪ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාබල රෙජිමේන්තු අතර ඇති එකම රයිෆල් රෙජිමේන්තුව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වන අතර ''නිර්භීත වේගවත්''යන ආදර්ශපාඨය සනාථ කරමින් පසුගිය වසර 30 ක් පුරා පැවති කුරිරු ත්‍රස්ථවාදය මාතෘභූමියෙන් මුලින් උපුටා දැමීම සදහා විශිෂ්ඨ දායකත්වයක් ලබාදුන් එකම රයිෆල් රෙජිමේන්තුව වශයෙන් ඉතිහාසගත වී ඇති මෙම රෙජිමේන්තුව වර්ෂ 2017 වර්ෂයේදී ජනාධිපති යෂ්ඨියෙන් ද පිදුම් ලබන ලදී.

පුරා දශක තුනක් ලක් දෙරණ වෙලාගත් කුරිරු යුද්ධය නිමාකර ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ වීරෝධාර රණවිරුවන් 3866 ක් තම අවසන් හුස්ම පොද වා තලයට මුසු කර ඇත. එමෙන්ම සිංහ රණවිරුවන් 7162 ක් තම ශරීර අවයවයන් මව්බිම වෙනුවෙන් පුජා කර ඇත.

එවන් අභිමානවත් රෙමේන්තුව ප්‍රෞඪත්වය විදහා දැක්වීම සඳහා රෙමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන සගරාවක් අප රෙජිමේන්තුව සතුව නොතිබීම විශාල අඩුවක්ව පැවතිණි. රෙජිමේන්තුවට අදාළ පුවත් සහ රෙජිමේන්තු නිලධාරීන් හා සෙසුනිලයන්ගේ ගද්‍ය, පද්‍ය සහ සාහිත්‍ය රචනා කුසලතාවන් ඔප් නැංවීමට අවශ්‍ය අවකාශය අවහිරවී තිබූ අවස්ථාවක මාගේ එක් අභිමතාර්ථයක් මල්ඵල ගැන්වීමක් ලෙස මෙ සගරාවේ මංගල කලාපය මෙලෙස එළි දැක්වීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

මෙසේ අද දින එළිදක්වන මෙම සගරාව අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය සියළුම ශක්තිය සහ ධෛර්යය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත ලැබේවායි මා ප්‍රාර්ථනා කරන අතර මෙම උත්කෘෂ්ට කාර්ය මල්ඵල ගැන්වීම සඳහා සහය දැක්වූ කාර්යමණ්ඩලය, නන් අයුරින් සහයෝගය දැක්වූ පාර්ශවයන්ටද, අනුග්‍රාහක භවතුන්ටද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරන අතර මංගල කලාපය සඳහා මෙලෙස සටහන් තැබීමට ලැබීම මා ලද ගෞරවයක් ලෙස සලකමි.

කුමුදු පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු ආඥාපතිවරුන්/අධිපතිවරුන්



බ්‍රිගේඩියර් ඩී විජේසිංහ
1988.05.09 සිට 1989.03.24



බ්‍රිගේඩියර් එච්වීස් හපුආරච්චි
1989.03.24 දින සිට 1992.12.21



බ්‍රිගේඩියර් ජීපී කුලතුංග ආර්එස්පී
1992.12.21 දින සිට 1995.01.10



මේජර් ජෙනරාල්
ජේ නම්මුණි යූඑස්පී
1995.01.10 සිට 1997.01.20



මේජර් ජෙනරාල්
එච්එස් හපුආරච්චි යූඑස්පී
1997.01.20 දින සිට 1998.01.01



මේජර් ජෙනරාල්
ජේ නම්මුණි යූඑස්පී
1998.01.01 දින සිට 1998.09.01



මේජර් ජෙනරාල් ජීඑස්සී ෆොන්සේකා
ආර්ඩබ්පි ආර්එස්පි පීඑස්සී
1998.09.02 දින සිට 2000.12.19



බ්‍රිගේඩියර් එස්ජී කරුණාරත්න ආර්ඩබ්පී
ආර්එස්පී පීඑස්සී
2000.12.20 දින සිට 2002.02.01



මේජර් ජෙනරාල්
ජීඑස්සී ෆොන්සේකා ආර්ඩබ්පි
ආර්එස්පි ආර්සීඩීඑස් පීඑස්සී
2002.02.02 දින සිට 2005.12.06



ලුතිතන් ජෙනරාල්
ජීඑස්සී ෆොන්සේකා ආර්ඩබ්පි ආර්එස්පි
විඑස්වි යූඑස්පි ආර්සීඩීඑස් පීඑස්සී
2005.12.06 දින සිට 2009.05.17



ජෙනරාල් ජීඑස්සී ෆොන්සේකා
ආර්ඩබ්පි ආර්එස්පි
විඑස්වි යූඑස්පි ආර්සීඩීඑස් පීඑස්සී
2009.05.18 දින සිට 2009.07.14



මේජර් ජෙනරාල්
ඩීආර්ඒබී ජයතිලක ආර්ඩබ්පී ආර්එස්පී
විඑස්වි යූඑස්පි එල්ඩීඑම්සී
2009.07.15 දින සිට 2012.08.18

රෙජිමේන්තු ආඥාපතිවරුන්/අධිපතිවරුන්



මේජර් ජෙනරාල්
එම්එච්එස්බී පෙරේරා ආර්ඩබ්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
2012.09.01 සිට 2017.12.03



මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න
ආර්ඩබ්පී එන්ඩියු පීඑස්සි
2017.12.03 සිට 2018.09.02



**වත්මන් රෙජිමේන්තු අධිපති**
මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා
ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යූඑස්පී එන්ඩියු
2018.09.03 සිට මේ දක්වා

# ෆීල්ඩ් මාෂල් ජීවස්සී ෆොන්සේකා
# ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පිඑස්සී



වසර 30 ක් පුරා අප රට ගොදුරු කරගත් ත්‍රස්ථවාදය මෑත යුගයේ රටට එල්ලවූ දැවැන්තම අභියෝගයක් වන්නට විය. තම මව්බිම ආර්ථික, සමාජිය හා දේශපාලනික වශයෙන් අරාජිකත්වයට පත්කරමින් ජාතියට තවත් බොහෝ දෑ අහිමි කරමින් පැවැති ම්ලේච්ඡ ත්‍රස්ථවාදය ජාතියේ ගමන් මග අවහිර කළේය. ඊට එරෙහිව ක්‍රියාත්මක කළ උතුරු නැගෙනහිර මානුෂීය මෙහෙයුම සාර්ථකව නිමකරමින් ත්‍රස්ථවාදය මව්බිමෙන් මුලිනුපුටා දැමීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට නිවැරදි නායකත්වයක් ලබා දෙමින් අභීත ලෙස යුද්ධ හමුදාව මෙහෙයවමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ෆීල්ඩ් මාෂල්වරයා වශයෙන් පත්වීමට සුදුසුකම් ලද්දේ අප රෙජිමේන්තුවෙන් ජාතියට දායද කල ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පිඑස්සී වීමද රෙජිමේන්තුව ලැබූ විරල අභිමානයකි.

වර්ෂ 1950 ක්වූ දෙසැම්බර් මස 18 වන දින අම්බලන්ගොඩදී ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා මෙලොව එළිය දුටුවේය. ඉන් අනතුරුව කෙමෙන් කෙමෙන් පාසැල් අධ්‍යාපනය නිමවූ විගස එනම් 1970 පෙබරවාරි මස 05 වන දින කෙඩෙට් නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්විය.

ආධුනික කෙඩෙට් නිලධාරියෙකු ලෙස දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයට ඇතුළත් වූ ඔහු එම පාඨමාලාව සාර්ථකව හදාරා දෙවන ලුතිතන් වරයෙකු ලෙස 1 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට සම්බන්ධ වන්නේ 1971 වර්ෂයේ ජූනි මස 1 වන දින දීය. එතැන් සිට 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හා යුද්ධ හමුදාවේ විවිධ තනතුරු හොබවා 1989 මැයි මස 14 වන දින සිට 1990 දෙසැම්බර් මස 01 වන දින දක්වා 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී තනතුර හොබවන ලදි. ඉන් අනතුරුව විවිධ තනතුරු හොබවා 1991 වර්ෂයේ අප්‍රේල් 1 වන දින කර්නල් නිලයට උසස්වීම් ලැබූ ඔහු 1991 නොවැම්බර් මස 07 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක වශයෙන්ද, පසුව ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ලෙසද සේවය කරන ලදි. පසුව 23 වන බළසේනාවේ බළසේනාධිපති තනතුරද හොබවනු ලැබීය.

වර්ෂ 1993 ක් වූ දෙසැම්බර් මස 01 වන දින බ්‍රිගේඩියර් නිළයට උසස්වීම් ලැබූ බ්‍රිගේඩියර් සරත් ෆොන්සේකා ප්‍රදේශ මූලස්ථානය මන්නාරමෙහි ආඥාපති, 5, 3, 21, 23 සහ 27 වන බළසේනාවන්හි බළසේනාධිපති, කාර්ය සේනාංක 1 හි නියෝජ්‍ය සේනාංකාධිපති, කයිට්ස් හා මන්ඩතිව් සම්බන්ධීකරන නිළධාරී, යාපනය 51 සේමුහි නියෝජ්‍ය සේනාංකාධිපති, වව්නියාව කාර්ය සේනාංක 2 හි කාර්යය නියුක්ත සේනාංකාධිපති, මිරුසවිල් 55 සේනාංකයේ කාර්යය නියුක්ත සේනාංකාධිපති වැනි යුධමය අතින් වැදගත් තනතුරු රාශියක් හෙබවූ අතර රිවිරැස හා ජයසිකුරු ක්‍රියාන්විතවලදි දක්ෂ ලෙස තම සේනාංක මෙහෙයවමින් ජයග්‍රහණයන් අත්පත් කර ගැනිමට ක්‍රියා කරන ලදි.

වර්ෂ 1998 පෙබරවාරි මස 23 දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ඔහු ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අධිපති වශයෙන් පත්වීම් ලැබුවේය. ඉන්පසුව ත්‍රිකුණාමලය 22 වන සේනාංකයෙහි සේනාංකාධිපති තනතුරට සහ යුද්ධ හමුදා අධ්‍යක්ෂක ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික තනතුරට ද පත්විය. යාපනය ආරක්ෂක සේනා මුලස්ථානයේ ආඥාපති තනතුරෙන් වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ ආඥාපති හා සේනාවිධායක ස්වේච්ඡා බලසේනා මූලස්ථානය සඳහා මේජර් ජෙනරාල් සරත් ෆොන්සේකා අනුයුක්ත කෙරිණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 18 වන යුද්ධ හමුදාධිපති වශයෙන් පත්වීම් ලැබූ මේජර් ජෙනරාල් සරත් ෆොන්සේකා එදිනම එනම් වර්ෂ 2005 ක් වූ දෙසැම්බර් මස 06 වන දින ලුතිනන් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබුයේ රුදුරු ත්‍රස්ථවාදයෙන් මාතෘභූමිය සම්පූර්ණයෙන්ම නිදහස් කර ගැනීමට නියත විවරණ ලබමිනි. මොහුගේ අද්විතිය නායකත්වය එල්ටීටීඊ ම්ලේච්ච ත්‍රස්ථවාදීන්ගේ විශාලතම අභියෝගය බව එම සංවිධානයේ නයකයා පසක් කරගෙන සිටි අතර, යුද්ධ හමුදාධිපති ධූරයට පත්වීම තුලින් එල්ටීටීඊයේ යුධ ශක්තිය විනාශ කිරීම සදහා අවශ්‍ය පිඹුරුපත් සකස් කර තිබූ බැවින් ඔහුගේ ජීවිතය විනාශ කිරීම සදහා සියලු උපක්‍රම යෙදූ අතර වර්ෂ 2006 අප්‍රේල් 25 දින යුධ හමුදා මූලස්ථානය තුලදීම මරාගෙන මැරෙන එල්ටීටීඊ කාන්තාවකගේ රුදුරු ප්‍රහාරයකට ගොදුරු විය. එසේ දැඩි ලෙස ආබාධිතව සිටියදීත් තම දේශයේ ආරක්ෂාව වෙනුවෙන් අධිෂ්ඨාන ශක්තිය දැඩි කරගත් මෙම ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයා නැවත තම රාජකාරිය මනා ධෛර්යකින් යුතුව ආරම්භ කරන ලදී.

එල්ටීටීඊ ත්‍රස්ථවාදීන් විසින් මාවිල්ආරු සොරොව්ව වසා දැමීම හේතුවෙන් එතෙක් පැවති සටන් විරාමයට කණ කොකා හැඬලීය. මින් පීඩාවට පත් ජනයා කෙරෙහි සානුකම්පිතව මානුෂිය මෙහෙයුම ඇරඹූණේ ඔහුගේ අණසක යටතේය. එම අද්වීතිය මාර්ගෝපදේශකත්වය යටතේ සාම්පූර්, වාකරේ, අයිත්තමලේ, තොප්පිගල, මුතූර්, අම්පාර,ඇතුළු සමස්ත නැගෙනහිර ප්‍රදේශයම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණසකට යටත් කර ගැනීමට හැකි විය. නැගෙනහිර ප්‍රදේශයේ ක්‍රියාන්විතයෙන් පසු මන්නාරම සිලාවතුර ප්‍රදේශය හා වව්නියාව ප්‍රදේශයද යුද්ධ හමුදාවේ අණසකට යටත් විය. අවසානයේ වසර 02 කට අධික කාලයක් තිස්සේ පැවති වන්නි මානුෂීය මෙහෙයුම අවසන් වූයේ එල්ටීටීඊ ත්‍රස්ථවාදි සංවිධානයේ මහ මොලකරු හට මරණය උරුමකර දෙමිණි. ඒ 2009 වර්ෂයේ මැයි මස 19 වන දාය.

වසර 30කට අධික කාලයක් තිස්සේ ශ්‍රී ලංකාද්වීපය පුරා පැවැති ත්‍රස්ථවාදී උවදුර යුද්ධ හමුදාධිපති වශයෙන් පත්වීම් ලැබීමෙන් අනතුරුව වසර 2 යි මාස 09 ක් වැනි කාලයකදී සම්පූර්ණයෙන්ම නිම කිරීමට සාර්ථකව අණදුන් යුද්ධ හමුදාධිපති ලෙසින් ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා ලක්දිව ඉතිහාසගත විය. එමෙන්ම එම දක්ෂතා අනුව හමුදා සේවයේ යෙදී සිටියදීම ජෙනරාල් පදවියෙන් පිදුම් ලැබීය.

අනතුරුව 2009 ජූලි මස 15 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙස පත්වීම් ලද අතර, වසර 39 මාස 09 ක සාර්ථක යුද්ධ හමුදා සේවා කාලයක් සම්පූර්ණ කරන ලද මෙම අභීත සෙන්පතිඳුන්, වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 14 වන දින යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි. ඉන් අනතුරුව ක්‍රියාකාරී දේශපාලන ප්‍රවාහයට පිවිසි තත් ජ්‍යෙෂ්ඨ නිළධාරී රටදැය වෙනුවෙන් කල සේවය අගයමින් 2015 මාර්තු 22 දින ෆීල්ඩ් මාෂල් ධූරයට උසස් කරනු ලැබීය. ෆිල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා ඉතා කටුක හා දුෂ්කර ගමන් මගක පැමිණ තම ස්වකීය රට ජාතිය ආරක්ෂා කර ගැනීම සදහා වූ අනුපමේය සේවය සියළු ශ්‍රී ලාංකිකයන් වර්ථමානය සහ අනාගතයෙත් කෘතවේදීව සිහිපත් කරනු ඇත.

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සැරයන් මේජර්වරුන්


බනි 1 බිඩී මිල්ටන්
(1989.11.07 සිට 1990.03.01)


බනි 1 ආර්එම් පියතිස්ස
(1990.03.01 සිට 1991.01.01)


බනි 1 එස්එච්එම් සිල්වා
(1991.01.01 සිට 1993.02.18)


බනි 1 ඩීඑල්කේ ද සොයිසා
(1993.02.18 සිට 1993.04.30)


බනි 1 එම් නන්දසේන
(1993.04.30 සිට 1995.11.28)


බනි 1 ඒඑම් රාජරන් බණ්ඩා
(1995.11.28 සිට 1997.11.20)


බනි 1 පිඑල්එස්එල් කුරේ ඩබ්වී
(1997.11.20 සිට 2002.01.07)


බනි 1 එස් විජිත්
(2002.01.07 සිට 2005.06.24)


බනි 1 ඒඑම් කපිලරත්න යූඑස්පී
(2005.11.06 සිට 2009.05.30)


බනි 1 එල්එල්කේ වීරසිංහ
(2009.05.30 සිට 2010.06.04
2011.03.07 සිට 2011.10.03)


බනි 1 එච්පීකේඒආර් ජයලත්
(2010.06.04 සිට 2011.03.07)


බනි 1 ඩීඑල්යූ රංජිත් යූඑස්පී
(2011.10.13 සිට 2012.12.01)

## රෙජිමේන්තු මාණ්ඩලික සැරයන් මේජර් වරුන්



බනි 1 කේඑම් බන්දුල ආර්එස්පී
(2012.12.01 සිට 2014.01.10)



බනි 1 ආර්එම් ප්‍රේමරත්න ආර්එස්පි
(2014.01.11 සිට 2015.03.31)



බනි 1 වයි එම් විරකෝන් බංඩා
(2015.03.31 සිට 2016.02.25)



බනි 1 පිඑම්ජේකේ පතිරාජ
(2016.02.25 සිට 2016.06.08)



බනි 1 ඒඒඑන්පි අමරසිංහ (වැ:බ)
(2016.06.08 සිට 2016.11.08)



බනි 1 ඊපි සිසිරකුමාර
(2016.11.08 සිට 2018.09.12)



බනි 1 එම්ජී සමරනායක
(2018.09.12 සිට මේ දක්වා)

# පරම වීර විභූෂණයෙන් පිදුම් ලද සිංහ විරුවන්



## කපිතන් අලදෙනිය

ශ්‍රී ලංකාවේ රූපවාහිණි සේවය ආරම්භ කිරීමත් සමගම උතුරු ප්‍රදේශයටද සන්නිවේදන සේවාව ලබා දීමේ අරමුණින් රූපවාහිණි සංස්ථාව මගින් කොකාවිල් කඳවුරෙහි ස්ථානගත කර තිබූ රූපවාහිණී ප්‍රති විකාශණ කුළුනෙහි ආරක්ෂාව සැපයීම සඳහා 3 (සෙව්) ශ්‍රීලංසිරෙ අනුබණ්ඩයක් ස්ථානගත කෙරුනු අතර එහි බණ්ඩභාර නිලධාරි ලෙස නි/3113 ලුතිතන් එස්යූ අලදෙනිය කටයුතු කරන ලදී.

1990 ජූලි මස 10 හා 11 යන දිනයන් වලදී එල්ටිටිඊ ත්‍රස්ථවාදීන් විසින් කොකාවිල් කඳවුරට ඇති සියළු සැපයීම් මාර්ගයන් අවහිර කරන ලදී. ආධාරක භට පිරිස් වල සහය ලබා ගැනීමට අසීරු තත්වයක් යටතේ ලුතිතන් එස්යූ අලදෙනිය සැබෑ නායකයකු ලෙසින් තමා යටතේ සිටි භට පිරිස් ඉතාමත් විශිෂ්ඨ ලෙස මෙහෙයවමින් අඛණ්ඩව දින 02 ක් පුරා ආහාර හා ජලය පවා නොමැතිව ත්‍රස්ථවාදීන් හට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ඔවුන් හට බරපතල හානි සිදු කරන ලදී.

ඉහල මූලස්ථානයන් වෙතින් සටනට මුහුණ දීමට අපහසු නම් කඳවුර අතහැර උපක්‍රමශීලීව පසුබසින ලෙස උපදෙස් ලබා දුන්නද සටනේදී මියගිය, තුවාල ලත් තම සහෝදර භටපිරිස් හා කඳවුර අතහැර පසුබැසීම කිසිසේත් සිදු කල නොහැකි බවත් ගුවන් යානා මඟින් කඳවුර තුළට බෝම්බ හෙලා ඔවුන් සමඟ සතුරාත් එකවර විනාශ කරන ලෙස අවධාරණයෙන් පවසා සිටින ලදී. මෙසේ සටන් කරමින් සිටියදී කඳවුරේ ඉන්ධන ටැංකිය මතට ත්‍රස්ථවාදීන් විසින් එල්ල කල මෝටාර් ප්‍රහාරයක් හේතුවෙන් එය පුපුරා මුළු කඳවුරම ගිනි ඇවිලී විනාශ විය. එහිදී එතෙක් සතුරා සමග අභීතව සටන් කරමින් සිටි ලුතිතන් අලදෙනිය ඇතුලු වීර සෙබළුන් ජීවිතක්ෂයට පත් විය.



## සැරයන් අනුර

7 බළඇණිය සිංහ රෙජිමේන්තුවට අයත් සැරයන් අනුර ඒච්ම් තම බළඇණිය සමඟ මාතෘ භූමියේ උතුරු ප්‍රදේශය ත්‍රස්ථවාදීන්ගෙන් මුදා ගැනීමේ මානුෂීය මෙහෙයුමට සක්‍රීයව දායක වෙමින් පෙරියතම්පනේ ප්‍රදේශයේ රාජකාරි කරන ලදී.

2007.11.11 වන දින ඔහුට මෙන්ම ඔහුගේ ඒකකයටද තවත් විශේෂිත දිනයක් විය. ඊට හේතු වූයේ පෙරදා තමා කුඩා කණ්ඩායමක් සමඟ ගොස් නිරීක්ෂණය කර එක්රැස් කර ගත් තොරතුරු වලට අනුව සතුරු භූමියේ පිහිටි ත්‍රස්ථ යුධ අගල් කිහිපය අත්පත් කර ගැනීමේ ක්‍රියාන්විතය යෙදී තිබූ බැවිනි.

උපක්‍රමශීලිව තම කණ්ඩායමට නිසි නායකත්වය ලබා දෙමින් ඉදිරියට ඇදුණු මෙම ජ්‍යෙෂ්ඨ කොනොනි හට ඉදිරි සතුරු බංකර් පෙළෙහි ත්‍රස්ථවාදීන් මුර රාජකාරියේ යෙදී සිටින බව නිරීක්ෂණය විය. උපක්‍රමිකව සතුරු අගල අසලට ලංවූ මොහු ඇතුළු පිරිසට දරුණු ත්‍රස්ථ ප්‍රහාරයකට මුහුණ දීමට සිදුවිය. නොසිතු මොහොතක එල්ලවූ ප්‍රහාර හමුවේ ප්‍රති ප්‍රහාර එල්ල කල ත්‍රස්ථවාදීන්ගේ ප්‍රහාර හේතුවෙන් දරුණු ලෙස තුවාල ලත් මෙම ජ්‍යෙෂ්ඨ කොනොනි තමා ප්‍රගුණ කර තිබූ යුධ උපක්‍රම හා ආත්ම ශක්තිය තුළින් තමා හට සිදුවී ඇති තුවාලද නොසලකා දිගටම ප්‍රහාර එල්ල කරමින් ත්‍රස්ථවාදීන් වෙත තවදුරටත් දිව යන ලදී. දැඩි ලෙස ප්‍රහාරයට ලක්වූ ත්‍රස්ථවාදීන් එකා පිට එකා වැටෙනවාත් සමගම, ඒ වන විටත් දරුණු ලෙස තුවාල ලබා සිටි මෙම වීරෝධාර ජ්‍යෙෂ්ඨ කොනොනි තම අතෙහි තිබූ අත් බෝම්බය යුධ අඟල වෙත එල්ල කරමින් තම අවසන් හුස්ම පොදින් වාතලය උණුසුම් කලේ ශ්‍රී ලාංකීය මාතෘ භූමියට තවත් එක් වීර පුතෙකුගේ අහිමි වීම සනිටුහන් කරමිනි.



## හසලක කෝප්‍රල් ගාමිණී කුලරත්න

උතුරු ආඥා බලප්‍රදේශය යටතේ පිහිටි යාපනය අර්ධද්වීපයට ඇතුළු වීමට තිබූ ප්‍රධානතම පිවිසුම් දොරටුව හා එකම ගොඩබිම් මාර්ගය පිහිටි ප්‍රදේශයේ බලය තහවුරු කිරීමට ස්ථානගතව තිබූ අලිමංකඩ කඳවුරෙ 6 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව 1990 ඔක්තෝම්බර් මස සිට රාජකාරිය ඉටු කරන ලදී. යාපනය කොටුව කන්කසන්තුරය කිලිනොච්චිය වැනි හුදකලා කඳවුරු වලට පහර දීමට පැමිණි අවස්ථාවන් වලදී ත්‍රස්ථවාදීන් දරුණු පරාජයන්ට ලක්වීම හේතුවෙන් ඔවුන්ගේ එකම අරමුණ හා අභිප්‍රාය වූයේ අලිමංකඩ අල්ලා ගැනීමෙන් යාපනය අර්ධද්වීපය ස්ථානගත වී සිටින ආරක්ෂක හමුදාවන්ගේ සැපයුම් මාර්ග අවහිර කර මුළු යාපනය අර්ධද්වීපය සියතට ගැනීමයි.

1991.07.13 වන දින රාත්‍රිය එලඹෙත්ම ත්‍රස්ථවාදීන් විසින් කඳවුර වටකර පහර දෙන්නට විය. ඒ සඳහා ඝන යකඩ තහඩු වලින් ආවරණය කරන ලද බුල්ඩෝසර් උපයෝගි කර ගනිමින් එම ප්‍රහාර තව තවත් දැඩිකරමින් පහර දෙන්නට වූ අතර, කඳවුරේ එක් පැත්තකින් ආරක්ෂක වලල්ල බිඳ දමමින් ඉදිරියට ඇදීමේදී නැවත සංවිධානය වූ ආරක්ෂක හමුදාවෝ එය අත්පත් කර ගැනීමට සමත් වන ලදී. මේ ආකාරයට අලිමංකඩ කඳවුරේ දරුණු ලෙස සටන් ඇවිලෙමින් තිබූ මොහොතක ත්‍රස්ථවාදීන් විසින් සන්නද්ධ කරන ලද දැවැන්ත බුල්ඩෝසරයක් කඳවුරේ දකුණු පසින් තිබුනු බංකර් විනාශ කරමින් කඳවුර තුලට පැමිණ පහර දෙන ලදී. මොහොතකින් සිදුවන්නට යන විනාශයත් කඳවුර සතුරන් අතට පත්වීමෙන් මුළුමහත් දේශයටම සිදුවන විශාල පාඩුවක් තේරුම් ගත් ගාමිණී කුලරත්න ක්ෂණිකව ක්‍රියාත්මක වී කිසිවකුගේ අණ දීමකින් හෝ බලපෑමකින් තොරව ත්‍රස්ථවාදීන්ගේ ප්‍රහාර මධ්‍යයේ ඉදිරියට ඇදෙන බුල්ඩෝසරයේ ඇතුලු වීමට තිබූ ආධාරක ඉණිමග දිගේ නැග අත්බෝම්බ දෙකක් ඒ තුලට දමා බුල්ඩෝසරයේ ඇතුලත සම්පූර්ණයෙන්ම පුපුරවා හරින ලදී. ඒ සමඟම එල්ටිටිඊ ත්‍රස්ථවාදීන් විසින් කිසිවිටෙකත් බලාපොරොත්තු නොවූ මොහොතක එල්ල වූ මෙම දැවැන්ත ප්‍රති ප්‍රහාරය හේතුවෙන් ඔවුන්ගේ සියළුම ක්‍රියාකාරකම් අඩපණ වීමත් සමගම ත්‍රස්ථවාදීන් විනාශ කර අලිමංකඩ කඳවුර ආරක්ෂා කර ගැනීමට කෝප්‍රල් ගාමිණී කුලරත්න ඇතුළු 6 වන සිංහ බලඇණියේ සිංහ විරුවන්ට හැකිවිය.



## ලාන්ස් කෝප්‍රල්
## අබේරත්න බංඩා

21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ “ සී ” කණ්ඩායමේ 8 දෙනෙකුගෙන් යුත් කුඩා කණ්ඩායමක සාමාජිකයෙකු වශයෙන් 2009 ජනවාරි මස 29 වන දින පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ ඉදිරි ආරක්ෂක වළල්ලට ඉදිරියෙන් ඉදිකර තිබූ ත්‍රස්ථවාදීන්ගේ බංකර් පෙළක් අත්පත් කර ගැනීමේ ක්‍රියාන්විතයට සහභාගී වන ලදී.

ත්‍රස්ථවාදීන් විසින් ඉදිකර තිබූ ශක්තිමත් ඉදිරි ආරක්ෂක වළල්ලේ පිහිටි බංකරයක් තුල සිට දෛනිකව දැඩි ලෙස සුළු අවි සහ බර අවි උපයෝගී කරගෙන ප්‍රහාර එල්ල කරමින් සිටින ලදී. එමෙන්ම ත්‍රස්ථවාදීන් විසින් මෙම ස්ථානයේ සිට මිතුරු පක්ෂයේ සෙබළු සිටි වැදගත් ස්ථානයන් නිරීක්ෂණය කරමින් සුළු අවි/ කාලතුවක්කු සහ මෝටාර් ප්‍රහාරයන්ද එල්ල කරන්නට විය. මෙසේ දිනෙන් දින එල්ල වූ ත්‍රස්ථවාදී ප්‍රහාර හමුවේ ඔවුන්ගේ ශක්තිමත් ඉදිරි ආරක්ෂක වලල්ල විනාශ කිරීමේ භාරදූර කාර්යයට සහය දක්වමින් මෙම සෙබලා ඇතුලු කුඩා කණ්ඩායම සහභාගි වන ලදී. ඒ අනුව උසස් නිලධාරීන්ගේ උපදෙස් වලට අදාලව තම කුඩා කණ්ඩායම වෙත නිසි සහයන් ලබාදෙමින් 2009 ජනවාරි මස 29 වන දින ක්‍රියාන්විතය සැලසුම් කරගත් ආකාරයටම ක්‍රියාත්මක කරන්නට විය.

මෙම සෙබලා ඇතුලු 8 දෙනෙකු ගෙන් සමන්විත කුඩා කණ්ඩායම් විසින් එම ප්‍රදේශයේ වල දමා තිබූ පුද්ගලනාශක බෝම්බ, ක්ලේමෝ බෝම්බ සහ මර උගුල් ගැනද නොතකා තම අරමුණ අරඹයා ඉදිරියට සූක්ෂම අයුරින් ඉදිරියට ගමන් කරමින් ත්‍රස්ථවාදී බංකර් පෙළට ආසන්න ත්‍රස්ථවාදීන් වෙත ඉතා නිර්භීත ලෙස දැඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. මෙහිදී ත්‍රස්ථවාදීන් විසින් පෙරලා එල්ල කරන ලද ප්‍රහාර හේතුවෙන් ඉතා දරුණු ලෙස තුවාල ලබා සතුරා විසින් වට කරනු ලදුව සිටියදීත් තම අත රැඳි ගිනි අවිය අත නොහැරම දිගින් දිගටම සතුරා වෙත නොබියව ප්‍රහාර එල්ල කරන ලදී. තමා සතු පතුරොම් සියල්ල නිම වූ පසු තුවාල ලබා වැතිර සිටි සෙසු සාමාජිකයින්ගේ ගිනි අවි වල රැඳි පතරොම් ද උපයෝගි කරගෙන අභීත කේශාරාවය කොට නැගී සිටිමින් සතුරා වෙත විශ්මිත ප්‍රහාරයක් එල්ල කරන ලදී. එතෙකිනුදු නොනැවතුන ලංකා මාතාවගේ මෙම අභිමානවත් සුජාත පුත්‍රයා තම කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ගේ දිවි බේරා ගැනීමේ පරම අදිටනින් තම ජීවිතය සතුරා අතට පත්වීමට ඉඩ නොදී තමා සතු අත් බෝම්බය වට කොට සිටි ත්‍රස්ථවාදීන් ඉලක්ක කොට පුපුරවා ගනිමින් ත්‍රස්ථවාදීන් තිදෙනෙකු ජීවිතක්ෂයට පත් කරමින් තම උත්තරීතර ජීවිතය දිනූ මාතෘභූමිය වෙනුවෙන් පූජා කරන ලදී. මෙසේ තම වටිනා ජීවිතය පූජා කරමින් වට කොට සිටි ත්‍රස්ථවාදීන් මරා දමමින් එල්ල වූ ත්‍රස්ථ ප්‍රහාරය මැඩලීම හේතුවෙන් තම පෙලේ සෙසු සාමාජිකයින්ගේ චිත්ත ධෛර්ය ඉහල මට්ටමක පවත්වා ගනිමින් තම අරමුණ සාක්ෂාත් කරගැනීමේ හේතුවෙන් ශක්තිමත් බංකරය සියතට ගැනීමට හැකිවන ලදී.

මෙසේ ඥානාන්විතව තම පෙළට සහාය ලබාදෙමින් පෙළක් සමඟ ගමන් ගත් මෙම සෙබලා කරන ලද අසමසම වීරක්‍රියාව හේතුවෙන් ක්‍රියාන්විතයේ අරමුණ මුදුන්පත් කරගැනීමට හැකිවිය. තවද මෙම සෙබළා ක්‍රියාන්විතයේ අරමුණ සාක්ෂාත් කරගැනීමේ පරම අභිලාෂයෙන් යුතුව ක්‍රියා කලේ ජීවිතයට විය හැකි හානියද පසෙක තබමින්ය. කුඩා කණ්ඩායමේ භට පිරිස් වෙත නිවැරදි සහය දක්වමින් තම අභිප්‍රාය මුදුන්පත් කර ගැනීමට ක්‍රියා කරමින් සතුරු කණ්ඩායම විනාශ වන පරිද්දෙන් තම අත්බෝම්බය පුපුරවා ගැනීමෙන් 2009 ජනවාරි මස 29 වන දින මෙම වීර සෙබළා මිය යන ලදී.



## ලාන්ස් කෝප්‍රල්
## රාජපක්ෂ

12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු වශයෙන් රාජකාරි කල සෙ/371780 ලාන්ස් කෝප්‍රල් මහින්ද රාජපක්ෂ කේජී හට 2008.12.22 වන දින තීරණාත්මක දිනයක් විය. එනම් මීට ප්‍රථම උත්සහ කර බිඳ දැමීමට නොහැකි වූ ත්‍රස්ථවාදී ආරක්ෂක බැම්ම මත ස්ථාන ගත කර තිබූ බංකර් පෙළ නැවත වතාවක් අල්ලා ගැනීමට දින නියම වීමයි.

පෙරට වඩා සංවිධානාත්මකව ක්‍රියාන්විතය දියත් විය. අට දෙනෙකුගෙන් යුත් මිතුරු කණ්ඩායම් කිහිපයක් ත්‍රස්ථවාදී බංකර් පෙළ වෙත උපක්‍රමශීලිව ලං විය. ඔහු අයත් කුඩා කණ්ඩායම සතුරන්ට දැඩි ප්‍රහාරයක් එල්ල කිරීමට පටන් ගත්තේය. එහෙත් නොසිතූ ලෙස සතුරු ප්‍රහාර දැඩි වෙද්දී කෝප්‍රල් මහින්ද රාජපක්ෂ ඇතුලු භට පිරිසට තම හිස බිම හොවා සිටීම හැර කල අන් කිසි දෙයක් නොවීය. මේ අවස්ථාවේදී මොහොතකින් සතුරන් තම මිතුරු සෙබළුන් වෙත කඩා වදින බවත් එසේ වුවහොත් තමා ඇතුලු සියළු දෙනාගේ ජීවිත අහිමි වන බවත් මෙම වීර සෙබලාට අවබෝධ විය. ක්ෂණිකවම තීරණයක් ගත් ඔහු තමාගේ අනෙක් පස සිටි සහෝදර සෙබලාගේ ආර්පීජී අවිය අතට ගත්තේය. අසුරු සැණෙකින් නැගී සිට දැඩි සතුරු ප්‍රහාර මධ්‍යයේ ඉදිරියේ ඇති සතුරු බංකර් පෙළ වෙත ආර්පීජී ප්‍රහාරය එල්ල කරමින් ඒ දෙසට දිව ගියේ සියළුම දෙනා මවිතයට පත් කරමිනි.

බංකර් පෙළ වෙත එල්ලවූ උණ්ඩ පුපුරා ගියේ ඒ තුල සිටි ත්‍රස්ථවාදීන් ද විනාශ කරමිනි. ප්‍රහාර සමඟ බංකරයක් තුලට ඇතුලු වූ කෝප්‍රල් මහින්ද රාජපක්ෂ එහි ප්‍රහාර එල්ල කරමින් සිටි සතුරන් හතර දෙනෙකුද විනාශ කරන ලදී. ඉන් නොනැවතුනු ඔහු යාබද බංකර් තුනක් ද විනාශකර හතරවන බංකරය වෙත පිවිසෙනවාත් සමඟ සතුරු වෙඩි උණ්ඩයක් ඔහුගේ ලය පසාරු කලේ ශ්‍රී ලංකා මාතාවට තවත් එක් වීර පුතෙකු අහිමි කරමිනි.

# සිංහ රෙජිමේන්තු සුරතලා



ගල් යුගයේ සිටම මිනිසාගේ විවිධ ඕනෑ එපාකම් ඉටුකර දීමට සිවුපාවුන් පුහුණු කල හෙයින් පසුකාලීනව සතුරන් මැඩලීමට සත්ව සහයෝගික සේනාංක බිහිවිය. ඒ අනුව අපේ පැරණි රජවරුන් තම හමුදා සේනාංක ශක්තිමත් කිරීම සඳහා  ඇත්, අස් වැනි සතුන් පුහුණු කර යුද කටයුතු වලදී මූලිකත්වයෙහිලා තබා ක්‍රියාකර ඇති බවට සාක්ෂි ඇත. එවැනි හමුදා සේනාංක ශක්තිය වර්ධනය වන විට පසුකාලීනව සන්නද්ධ සංස්කෘති විදහා දැක්මක ඉල්ලුම ද ක්‍රමානුකූලව ලොව වර්ධනය විය. ලංකා යුද්ධ හමුදා නිත්‍ය බළසේනාවේ පළමුවෙන් බිහි වූ රයිෆල් බළඇණියට සුරතල් සතෙකුගේ ක්‍රියාකාරකම් පෙන්වීමට සිහින මැවූ එවකට සිංහ රෙජිමේන්තු ප්‍රථම අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්ඩී ජයතිලක කුණ්ඩසාලේ කෘෂිකර්ම ගොවිපළෙන් "සානන්" (SAANAN) වර්ගයට අයත් එළුවෙකු බළඇණියට රැගෙන එන ලදි.





"ටෝජෝ" නමින් හැඳින්වූ එම සුරතලා රෙජිමේන්තු සැරයන් මේජර් මෝසත් ටීඑෆ්ජී යටතේ සරඹ පෙළපාලිවලට සහභාගි විය. වර්ෂ 1961 දී මහනුවර පැවැත් වූ නිදහස්  පෙළපාලියේ සිංහ සෙබළුන් සමග අභිමානවත් අන්දමින් ගමන් කිරීමෙන් ප්‍රථම මංගල ගමන ඇරඹූ" ටෝජෝ" ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ අත්පොළසන් නදින් පිළිගැනීම්වලට ලක්වෙමින් අනුරාධපුරය, ගාල්ල, බදුල්ල, කුරුණෑගල යන නගරවල පැවැති නිදහස් සැමරුම් උත්සව වලටද සහභාගි විය. ඒ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රථම වරට රෙජිමේන්තු සුරතලෙකු සරඹ පෙළපාලියකට ඉදිරිපත් කිරීමේ ගෞරවයද සිංහ රෙජිමේන්තුවට හිමිවේ.

ටෝජෝ මියයෑමෙන් පසු 1977 කාල වකවානුවෙහි අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩීඩබ් හපුආරච්චි සහ මේජර් ජේ නම්මුණි දෙහිවල සත්වෝද්‍යානයේ නිලධාරින් සමග සාකච්ඡා කොට යුද්ධ හමුදා පෙළපාලි හා උත්සව අවස්ථාවලට යොදා ගැනීම සඳහා පුරුදු පුහුණු කිරීමට සත්වෝද්‍යානයෙන් සිංහ පැටවෙකු ලබාගැනීමට ක්‍රියාකරන ලදි.

මොරාන් (Moran) යන නම ලද මෙම සිංහ සුරතලා වර්ෂ 1978 ජනවාරි මස 18 සහ 22 යන දිනයන්හි කොළඹ දී පැවැත් වූ යුද්ධ හමුදා පිරික්සුම් පහන් සංදර්ශනය (ARMY SEARCH LIGHT TATOO) සඳහා සහභාගි කරවා ගන්නා ලදි. වර්ෂ 1978 පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති නිදහස් දින උත්සවයේදී මෙම සිංහ සුරතලා ආචාර පෙළපාලියට සහභාගි වීම විශේෂතම සිදුවීමක් විය. පළමු සිංහ සුරතලාගේ මියයෑමෙන් පසු මේජර් ජෙනරාල් එල්ඩීසීඊ වෛද්‍යරත්න එන්ඩීසී පිඑස්සී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන වශයෙන් කටයුතු කරමින් සිටියදී මාස 06 ක් වයසැති සිංහ පැටවෙකු රෙජිමේන්තුව වෙත පරිත්‍යාග කර ඇත. මෙම සිංහ සුරතලා "කූගර්" යනුවෙන් හඳුන්වන ලදි. වසර 07 කුත් මාස 06 ක් රෙජිමේන්තුවේ ඉතා කීකරුව සිටීමෙන් පසු මෙම සිංහයා 1996.10.09 දින මිය ගියේය.  එම සිංහ සුරතලාගේ මරණයෙන් පසුව 1996.10.17 වන දින නැවතත් සිංහ සුරතලෙක් රෙජිමේන්තුවට එක්විය. මාස තුනක් පමණ වයසැති වූ මෙම සිංහ පැටවා 1996.07.17 දින දෙහිවල සත්වෝද්‍යානයේදී උපත ලබා තිබුණි. මෙම සිංහ සුරතලා ද "කූගර්" නාමයෙන් හඳුන්වන ලද අතර වයස අවුරුදු 19ක ආයුකාලයෙන් පසු 2015 වර්ෂයේදී එම සිංහ සුරතලාද මියයාමෙන් පසු "නිරෝ" නමින් වූ සුරතලෙක් ද,  2017 අගෝස්තු මස 10 වන දින දෙහිවල සත්ව උද්‍යානය මගින් ලබා දීමෙන් අනතුරුව මස 03 ක් වයසැති සිංහ පැටවෙකු මෙම රෙජිමේන්තුවේ සුරතලා ලෙස නම් කල අතර, 2019 පෙබරවාරි මස 12 වන දින කූගර්ගේ හුදකලාව නැති කරමින් "එල්සා" නමින් සිංහ ධේනුවක් ද සිංහ රෙජිමේන්තුවේ සුරතලුන්ගේ පවුලට එක්විය.  මුලින්ම ටෝජෝ ද ඉන්පසු "කූගර්ලා" සහ "එල්සා" ද රෙජිමේන්තු නාමයට සමීපව සිය යුතුකම් කොටස මනාව ඉටුකරන ලද හෙයින් සිංහ රෙජිමේන්තු නාමය තව තවත් ජනතා හදවත් තුළ සමීපවීමට සිංහ සුරතලුන් බෙහෙවින්ම හේතු විය.







# රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිම කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් (2018.09.03 සිට මේ දක්වා)



නවීකරණයට පෙර



නවීකරණයට පසු

නවීකරණය කරන ලද රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්යාල සංකීර්ණය නව ගොඩනැගිල්ලක් ලෙස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්යාල සංකීර්ණය යුධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ජ්‍යෙෂ්ඨ නිළධාරි තුමන්විසින් 2019 සැප්තැම්බර් මස 21 වන දිනට යෙදුන සුභ මොහොතින් විවෘත කරන ලදි.



නවීකරණයට පෙර



නවීකරණයට පසු

අබලන්ව තිබූ කදවුර වටා පිහිටි වැට තාප්ප හා චේන් ලින්ක් යොදා  නවීකරණය කර 2019.02.13 වන දින රෙජිමේන්තු අයිතියට පත්කිරීම.



නවීකරණයට පෙර



නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථාන සෙසුනිල මුළුතැන්ගෙය නවීන මුළුතැන්ගෙයි උපකරණ සහිතව අලුත්වැඩියා කර 2019.02.13 දින යුද්ධ හමුදා පතිතුමන් අතින් සෙසුනිල අයිතියට පත්කිරීම




සෙසුනිල වැසිකිලි පද්ධතිය නව ජල පද්ධතියක් සහිතව නවීකරණය කිරීම



නවීකරණයට පෙර



නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථානය අඹේපුස්සෙහි ස්ථාපනය කර ඇති සෙසුනිල විවාහක නිවාස අලුත්වැඩියා කිරීම



නවීකරණයට පෙර



නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථාන කොනොනි භෝජනාගාරය අලුත්වැඩියා කිරීම

සංවර්ධන ව්‍යාපෘති


නවීකරණයට පෙර


නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරී නිවස්න අමුත්තන් රැදීසිටීමේ ශාලාව නවීකරණය කිරීම හා ඒ සදහා සරිලන ගෘහභාණ්ඩ යොදා සකස් කිරීම


නවීකරණයට පෙර


නවීකරණයෙන් පසු

නිලධාරී නිවස්න කාමර අංක 01 හා 02 නවීකරණය කිරීම


නවීකරණයට පෙර


නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරී නිවස්න බීම හල නවීකරණය කිරීම



නවීකරණයට පෙර



නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරී නිවස්න බිලියඩ් ක්‍රීඩාව සඳහා සුදුසු ස්ථානයක් සැකසීම



නවීකරණයට පෙර



නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරී නිවස්න රූපවාහිණී නැරඹුම් මැදිරිය නවීකරණය කිරීම



නවීකරණයට පෙර



නවීකරණයෙන් පසු

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පිවිසීමේ දොරටුව රෙජිමේන්තුවට අභිමානයක් ගෙන දෙන අයුරින් හා ආරක්ෂාව දැඩි වන ආකාරයෙන් නවීකරණය කර 2019.02.13 වන දින රෙජිමේන්තු අයිතියට පත්කිරීම



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන ක්‍රිකට් ක්‍රිඩාංගනයේ නවතමයෙන් ඉදිකරන ලද ක්‍රීඩා මණ්ඩපය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒජී පල්ලාවෙල ආර්ඩබ්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ ආරාධනය මත මේජර් ජෙනරාල් ආර්ඩබ්ඩබ්ඒඩ්බි රාජගුරු ආර්ඩබ්පි ආර්එස්පි විඑස්වි යුඑස්පි එන්ඩියු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් 2019 සැප්තැම්බර් මස 21 දින විවෘත කරන ලදි.





රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල අඛංඩ ජල සැපයුමක් පවත්වාගෙන යෑම සදහා පීඩන පොම්ප සවිකිරීමේ ව්‍යාපෘතිය

# රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා



## යුද්ධ හමුදාපති තුමන් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරය කරයි

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු ගේ ආරාධනය අනුව යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් එන් යූ එම් එම් ඩබ් සේනානායක ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී 2019.02.13 දින සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත පැමිණි යුද්ධ හමුදාපති තුමන් මහත් හරසරින් යුතුව රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු විසින් පිළිගන්නා ලද අතර උඩරට නැටුම් හා බෙර වාදනය මධ්‍යයේ අභිනවයෙන් ඉදිකළ ප්‍රධාන දොරටුව විවෘත කිරීම හා එහි සමරුඵලකය යුද්ධ හමුදාපති තුමන් අතින් නිරාවරණය කරන ලදී. එදින දිනය පුරා සිංහ පියසෙහි ගතකල යුද්ධ හමුදාපති තුමන් විසින් සිංහ විරුවන් වැඩ අවසන් කල ව්‍යාපෘතීන් රාශියක් සෙබල අයිතියට පත්කරන ලදී.

එදින වැඩසටහන් පෙළගැස්මේ අවසන් අධියර ලෙස යුද්ධ හමුදා සම්ප්‍රදායන් අනුගමනය කරමින් රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්, නිළධාරීන් සහ ඔවුනගේ භාර්යාවන් සමඟින් රාත්‍රී භෝජන සංග්‍රහයකටද සහභාගී විය.









# 2019 දෙවන කාර්තුවේ නිලධාරි පුහුණු දිනය සාර්ථකව පැවැත්විණි

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් 2019 දෙවන කාර්තුවේ නිලධාරී පුහුණු දිනය 2019 සැපතැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වී යුඑස්පි එන්ඩියු ගේ අධීක්ෂණය යටතේ පැවති එම වැඩසටහන සඳහා නිලධාරීන් 150 දෙනෙකු සහභාගී විය. එදින වැඩසටහන උදෑසන සැසිවාරය ශාරීරික අභ්‍යාස වලින් ආරම්භ කර ඉන් අනතුරුව අසි සරඹද පසුව "ආපදා කළමණාකරනය සහ එය අවම කර ගැනීම" පිළිබද දැනුම වර්ධනය කරගැනීමේ අරමුණ ඇතිව විශේෂ ආරාධිත දේශකයෙකු ලෙස ශ්‍රී ලංකා සන්නාහ හා සන්නද්ධ බළකායේ කර්නල් ඩබ්ඩබ්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියන්ගොඩ ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් ඉතා හරවත් දේශණයක් ද සිදුකරන ලදි. සන්ධ්‍යා කාලයේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව 9 වන බළඇණිය මගින් "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂාව සදහා සමාජ ජාල වලින් ඇති වන බලපෑම" යන තේමාව යටතේ ඉදිරිපත් කිරීමක් ද සිදුකල අතර එය කාලීන ප්‍රවණතා සබැඳිව විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීමක් විය. දිනය අවසානයේ "ඩයිනර්ස් ක්ලබ්" පවත්වනු ලැබූ අතර එහිදී සුසිල් ලියනගේ මහතා විසින් "වෙනස්වන ලෝකයේ නායකත්වය" යන මාතෘකාව ඔස්සේ කාලීන දේශනයක් පවත්වන ලදි.















# සිංහ මේලා 2019 සාර්ථකව නිමවෙයි










ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සංවිධානය කරන ලද සිංහ මේලා 2019 අධ්‍යාපන, වෙළඳ හා සංගීත ප්‍රසංගය අති විශාල ජනතාවගේ සහභාගීත්වයෙන් ජුනි මස 28 හා 29 දෙදින පුරාවට වරකාපොළ මහජන ක්‍රීඩාංගනයේදී සාර්ථකව පැවැත්විණි.

රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පි ආර්එස්පි විඑස්වි යුඑස්පි එන්ඩියු ජ්‍යෂ්ඨ නිලධාරීගේ පූර්ණ අධීක්ෂණය හා උපදෙස් මත සංවිධානය වූ මෙම අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ මියගිය, සේවයේ නියුතු, ආබාධිත තත්වයට පත්වූවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු ඉහළ නැංවීමයි.

සිංහ මේලා 2019 අධ්‍යාපන, වෙළඳ ප්‍රදර්ශනය හා සංගීත ප්‍රසංගයේ ජුනි මස 28 වන දින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ජ්‍යෙෂ්ඨ නිලධාරී සහභාගී වූ අතර, ජුනි මස 29 වන දින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ඉදිරි නඩත්තු පෙදෙස නැගෙනහිර ආඥාපති හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් මනෝජ් මුදන්නායක ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ද සහභාගී විය.

තවද සිංහ මේලා 2019 අධ්‍යාපන, වෙළඳ ප්‍රදර්ශනය හා සංගීත ප්‍රසංගයට සමගාමීව දිනුම් අදින ලද ලොතරැයි දිනුම් ඇදීමෙන් පලමු ත්‍යාගය වශයෙන් රුපියල් 300.000.00 ක් වටිනා බජාජ් ඩිස්කවරි යතුරු පැදියක්, දෙවන ත්‍යාගය වශයෙන් රුපියල් 175000.00 ක් වටිනා සැම්සුන්ග් අගල් 49” 4K ස්මාර්ට් ටීවී එකක්, තෙවන ත්‍යාගය වශයෙන් රුපියල් 115000.00 ක් වටිනා සැම්සුන්ග් ඉන්වර්ටර් දොර දෙකේ ශීතකරණයක් හා සැනසිලි තැගි වශයෙන් රුපියල් 25000.00 ක් වටිනා සැම්සුන්ග් ටැබ් පරිඝනක 5 ක් ද ලබා දෙන ලදී.

නිමි ඇඳුම්, ආහාරපාන හා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ඇතුලත් වෙළඳ කුටි මෙන්ම විනෝද ක්‍රීඩා, යුධ හමුදා සංදර්ශණ හා රාත්‍රිය පුරාවට දිවෙන සංගීත ප්‍රසංගයන්ගෙන් සැණකෙළි භූමිය වර්ණවත් විය.



# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සූර්ය මංගලය - 2019 උත්කර්ෂවත් ලෙස සමරයි

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ සිංහ සූර්ය මංගල්‍යය 2019 සිංහල හා දමිළ අලුත් අවුරුදු උත්සවය ඉරිදා (21) දින සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන ක්‍රීඩා පිටියේදී පවත්වනු ලැබීය.

රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ උපදෙස් මත මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් අජිත් පල්ලාවෙල ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ පූර්ණ අධීක්ෂණයෙන් සම්ප්‍රදායික ජන ක්‍රීඩා රැසකින් සමන්විත සිංහ සූර්ය මංගල්‍යය 2019 උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.











## රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා



**නව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු විසින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක**







මේජර් ජෙනරාල් එම්කේඩී පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී රාජකාරී භාරගැනීමෙන් පසු අඟහරුවාදා (09) දින රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි අතර නව පත්වීම් ලැබූ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මධ්‍යස්ථාන සේනාවිධායකතුමන් විසින් මහත් හරසරින් පිළිගනු ලැබූ අතර පසුව කදවුරු සම්මාන මුරයක් හා වර්ණවත් සම්මාන පෙළපාලියක් ලබා දෙන ලදී. අනතුරුව රණවිරු ස්මාරකය වෙත පැමිණි ඔවුන් මියගිය රණවිරුවන් සිහි කරමින් පුෂ්පෝපහාර දක්වන ලදී.

ඉන්පසු පැළයක් සිටුවීම සහ ඩී මුරහල වි විවෘත කිරීම සිදු කරන ලදී. අතර ලෙස රාජකාරී භාර ගැනීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත පැමිණීම සනිටුහන් කරමින් පැමිණ සිටි ජ්‍යෙෂ්ඨ නිළධාරින් සමුහ ඡයාරූපයකට පෙනී සිටින ලදි.







## 2019 වර්ෂයට අදාල වාර්ෂික පාලන පරීක්ෂාව





යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් එල්එච්එස්සී සිල්වා ඩබ්ඩබ්ව් ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩියු පිඑස්සි 2019 ජුලි මස 12 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය අඹේපුස්ස හිදී 2019 වර්ෂයට අදාල වාර්ෂික පාලන පරීක්ෂාව සදහා සහභාගී විය.

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක බ්‍රිගේඩියර් අජිත් පල්ලාවෙල ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි හරසරින් පිළිගත් අතර සම්මාන මුරයක්ද පිරිනමන ලදී.

## ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ක්‍රීඩා රාත්‍රිය සාර්ථකව අවසන් විය

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරීන් විසින් සංවිධානය කරන ලද නිලධාරි ක්‍රීඩා රාත්‍රිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු නිලධාරි නිවස්නයේ දි 2019 සැප්තැම්බර් මස 20 වන දින සන්ධ්‍යාවේදී පැවැත්විණි. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ජ්‍යෙෂ්ඨ නිළධාරි හා එම මැතිණිය සහභාගි වන ලදි. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු නිලධාරීන්, ඔවුන්ගේ බිරින්දෑවරුන් හා දුවා දරුවන් සමග මෙම ක්‍රීඩා රාත්‍රිය සදහා සහභාගී විය. විවිධ ක්‍රීඩා ඉසව් අහාරපාන හා ඩීජේ අංගයන් ඇතුලු විවිධ අංගයන් මීට ඇතුලත් විය.







# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රණවිරු අනුස්මරණ හා වාර්ෂික පිරිත් පිංකම 2019

30 වසරක කුරිරු ත්‍රස්ථවාදය මුලිනුපුටා දමමින් වර්ෂ 2019 ක් වූ මැයි මස 19 දින ශ්‍රී ලාංකීය මාතෘ භූමිය, නිදහස්, ස්වෛරී දේශයක් බවට පත් කරමින් මුලු මහත් ශ්‍රී ලංකාවාසීන් වෙත නිවහල් දේශයක් බිහිකිරීම වෙනුවෙන් දිවි පිදු ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් හා සෙසුනිළයන් සිහිකරමින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී දානමය පිංකමක් සහ සර්වරාත්‍රික පිරිත් දේශණයක් 2019 අගෝස්තු මස 24 සහ 25 යන දෙදින තුල පැවැත්විණි.

කුරිරු එල්ටීටීඊ ත්‍රස්ථවාදය තම මාතෘ භූමියෙන් මුලිනුපුටා දැමීමට ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් 144 ක් සහ සෙසු නිළයන් 3720 ක් දිවි පුදා ඇති අතර ඔවුන්ගේ ලගම ඥාතීන්ද මෙම දානමය පිංකමට සහ සර්වරාත්‍රික පිරිත් දේශණයට සහභාගී විය.

රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒ පි පල්ලාවෙල ආර්ඩබ්පි ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ආරාධනය මත ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම් කේ ඩි පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පි වීඑස්වී යූඑස්පී එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මෙම උත්සවය සදහා සහභාගී විය. එමෙන්ම විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, දැනට සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, කනිෂ්ඨ නිලධාරීන් හා සෙසුනිළයන්ද මෙම උත්වය සදහා සහභාගී විය.








# මේජර් ජෙනරාල් ඩීසි කැප්පෙට්වලාන ආර්එස්පී එන්ඩීයු පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විශ්‍රාම යාම

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා









මේජර් ජෙනරාල් ඩීසි කැප්පෙට්වලාන ආර්එස්පී එන්ඩීයු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විශ්‍රාම යාම වෙනුවෙන් සම්මාන පෙළපාලියක් රෙජිමේන්තු මධ්‍යස්ථායේදී  පැවැත්විණි.

වසර 35 කට නොඅඩු සේවා කාලයක් සපුරමින් මාතෘ භූමියට අනුපමේය මෙහෙයක් ඉටුකල මේජර් ජෙනරාල් ඩීසි කැප්පෙට්වලාන ආර්එස්පී එන්ඩීයු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් යුද හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම නිමිති කොටගෙන 2019 අගෝස්තු මස 13 වන දින අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන පෙළපාලියක් හා සියළු නිල තේපැන් සංග්‍රහයක් හා දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

# මේජර් ජෙනරාල් ආර්ඩබ්ඩබ්ඒඩීබී රාජගුරු ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ විශ්‍රාම යාම







මේජර් ජෙනරාල් ආර්ඩබ්ඩබ්ඒඩීබී රාජගුරු ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විශ්‍රාම යාම වෙනුවෙන් සම්මාන පෙළපාලියක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී  පැවැත්විනි.

වසර 35 කට නොඅඩු සේවා කාලයක් සපුරමින් මාතෘ භූමියට අනුපමේය මෙහෙයක් ඉටුකල මේජර් ජෙනරාල් ආර්ඩබ්ඩබ්ඒඩීබී රාජගුරු ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් යුධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීම නිමිති කොටගෙන 2019 සැප්තැම්බර් මස 21 වන දින අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන, පෙළපාලියක් හා සියළු නිල තේපැන් සංග්‍රහයක් හා රාත්‍රි භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විශේෂ අවස්ථා

# ස්වේච්ඡා බලකා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලිය - 2019 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම විසින් දිනා ගන්නා ලදී



ඉතා උද්යෝගිමත් හා උනන්දුවක් දක්වන වොලිබෝල් ක්‍රීඩකයින්ගේ අපේක්ෂාවන් සපුරාලමින් ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලකාය විසින් 2019 සැප්තැම්බර් 23 සිට 25 දක්වා කොළඹ සුගදාදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලිය 2019 සාර්ථකව පවත්වන ලදී.



පිරිමි වොලිබෝල් ශූරතාවලියේ අවසන් මහා තරගය සහ ත්‍යාග ප්‍රධානෝත්සවය 2019 සැප්තැම්බර් 25 වන දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී විය.



වොලිබෝල් ශූරතාවලියේ අවසන් මහා තරගාවලිය සඳහා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සහ ශ්‍රී ලංකා පාබල හමුදාව අතර තරගය ආරම්භ විය. කණ්ඩායම් දෙක උද්යෝගයෙන් හා තරුණ ශක්තියෙන් යුතුව පිටියට පිවිසියේ පිටියේ සිටි ප්‍රේක්ෂකයින්ට මහත් ප්‍රීතියක් ගෙන දෙමිනි අවසාන වශයෙන්, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත් අතර 2019 වසරේ අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලියේ ශූරයන් විය.



# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව අභිමානවත් 63 වන සංවත්සරය සමරයි

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 63 වන සංවත්සර දිනය අභිමානවත් අයුරින් 2019 ඔක්තෝම්බර් මස 01 වන දින අඹේපුස්ස රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී උත්සවශ්‍රීයෙන් සමරනු ලැබීය.

සංවත්සර දිනය වෙනුවෙන් සංවිධානය කර තිබූ උත්සව මාලාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වනු ලැබුයේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කුමුදු පෙරේරා ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ය. එතුමන් පිළිගනු ලැබුයේ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒ පී පල්ලාවෙල ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසිනි.

කඳවුරු සම්මාන මුරය ලබාදීමෙන් අනතුරුව සරඹ භූමියේදී රෙජිමේන්තු අධිපතිතුමන් වෙත සාම්ප්‍රදානුකූල ආචාර පෙළපාලියේ ගෞරවාචාරය පිරිනමනු ලැබීය. ඉන් අනතුරුව රෙජිමේන්තු අධිපතිතුමන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් හා සෙසුනිලයන් එක්ව රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිපත් කරමින් රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයෙහි පිහිටි රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර පුදකරනු ලැබිය.

ඉන් පසු රෙජිමේන්තුවේ නිළධාරී සෙසුනිලයන් සමග එක්ව සියළු නිළ භෝජන සංග්‍රහයක් භුක්තිවිදින ලද අතර අනතුරුව ක්‍රීඩා සන්ධ්‍යාවක්ද පැවැත්විනි. වැඩසටහන් පෙළගැස්මේ අවසන් අධියර වශයෙන් මහා සංගීත ප්‍රසංගයක් පැවැත්වු අතර ඒ සදහා රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් හා සෙසුනිළයන් සහභාගී විය.



# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාවනිතා ශාඛාව

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් සේවයේ නියතු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිළධාරින්ගේ බිරින්දෑවරුන්ගේ සෙසුනිළ රණවිරුවන්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ භාර්යාවන්ගේ සහය ඇතිව පිහිටුවා ගන්නා ලද සිංහ සේවාවනිතා ශාඛාව යුද්ධයේදී මියගිය යුද්ධයේදී තුවාල ලබා රණක්ෂිතයට පත් හා සේවයේ නියතු සියලුම නිළධාරීලසෙසුනිළ රණවිරුවන් සහ සිවිල් සේවක මහතුන් හට හා ඔවුන්ගේ ලගම ඥාතින්ගේ සුභසාධන කටයුතු කාර්යක්ෂමව ඉටුකර දිම මෙම ශාඛාවේ අරමුණ වේ.

### සිංහ තැණස

නැණස හා හැකියාවන් දියුණු කිරිම

(ආබාධිත සෙබළුන්, වැන්දඹුවන් දුවා දරුවන්, සෙවයේ සිටින සියළුම සෙබළුන්)

- ආබාධිත/වැන්දඹුවන් පුහුණු කිරිම
- දෙමසකට වරක් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම
- හැරවුමක ඇරඹුමක් නේවාසික ළමා වැඩසටහන(ජීවන කුසලතා වර්ධනය කිරීම)
- නොමිලේ මනෝ උපදේශන සේවාවන් සැපයීම
- සිංහ කතිකයන් පුහුණු කරීම

### සිංහ දිරිය

නිශ්පාදන

- චිල්සා වෙළද නාමය යටතේ නිශ්පාදන
- සිංහ දිරිය පොත් හා විසිතුරු භාණ්ඩ
- පුහුණුවලත් කථිකයන්
- ආබාධිත රණවිරු නිශ්පාදන
- වැන්දඹුවන්ගේ නිශ්පාදන

### SINHA CAFE

සිංහ නිශ්පාදන සදහා අලෙවි පොළ

- රෙජිමේන්තු අභිමානය ඉහල නැංවීම
- සිංහ විරුවන්ගේ නිශ්පාදන වලට ඉඩක් ලබාදීම
- ඔවුන්ගේ ආදායම් මාර්ග සහ ස්වයං රැකියා ඇතිකිරිම
- අතරමැදියන් නොමැතිව භාණ්ඩ අලෙවි කිරිම

# සිංහ නැණස

සෑම පුද්ගලයෙකුටම ආවේණික දක්ෂතාවයන් ඉස්මතු කරගැනීම සදහා අවශ්‍ය දැනුම සහ කුසලතාවයන් ලබාදීම සඳහා සිංහ නැණස ව්‍යාපෘතිය සිංහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය වන ශිරෝමි මාසකෝරාල මැතිණියගේ සංකල්පයකට අනුව 2018.09.30 වන දින සිංහ රෙජිමේන්තුව වෙත හදුන්වාදෙන ලදී.

## "මුල් ළමාවිය ගතකරන දරුවන්ගේ ආරක්ෂාව හා දෙමාපියන්ගේ කාර්‍ය භාර්‍යය" යන මාතෘකාව යටතේ ඉතාමත් හරවත් මෙන්ම කාලෝචිත දේශණයක්

"මුල් ළමාවිය ගතකරන දරුවන්ගේ ආරක්ෂාව හා දෙමාපියන්ගේ කාර්‍ය භාර්‍යය" යන මාතෘකාව යටතේ ඉතාමත් හරවත් මෙන්ම කාලෝචිත දේශණයක් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්‍යාංශයේ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මනෝජ් සමරසේකර මහතා විසින් 2018.10.30 වන රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුකරන ලදී. එම අවස්ථාව සඳහා මෙම රෙජිමේන්තුවට අයත් රණවිරුවන්/ ඔවුන්ගේ භාර්‍යාවන් 1000 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි විය.





# හැරවුමක ඇරඹුමක් යන තේමාව යටතේ අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන

හැරවුමක ඇරඹුමක් යන තේමාව යටතේ අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන ප්‍රවීණ මනෝවිද්‍යා උපදේශක චන්දන ගුණවර්ධන මහතා විසින් 2018.12.18 වන දින සිට 2018.12.22 දින දක්වා නේවාසිකව පුරා දින 05 ක් සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිංහ රණවිරුවන්ගේ දූ දරුවන් 68 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථකව අවසන් කරන ලදී. මෙහි ආරම්භය සනිටුහන් කිරීම සිංහ සේවාවනිතා ශාඛාවේ සභාපති තුමියගේ හා ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් සිදුකරන ලද අතර මෙම වැඩසටහනෙහි සහතිකපත් ලබාදීම සහ කුසලතාවයන් එළිදැක්වීම ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මෙන්ම සිංහ රෙජිමේන්තු අධිපති තුමන් වන මේජර් ජෙනරල් කුමුදු පෙරේරා ජ්‍යෙෂ්ඨ නිළධාරි තුමාගේ හා සිංහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිණී ශිරෝමී මාසකෝරාල මැතිණියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මන්ත්‍රණ සභාවේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සහ දු දරුවන්ගේ දෙමාපියන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී.








## මතින් තොර සෙබල පිරිසක් සිංහ රෙජිමේන්තුව තුලින්

2019 වර්ෂය නව දැක්මක් තුලින් ඉදිරියට යාම සඳහා මතින් තොර සෙබල පිරිසක් සිංහ රෙජිමේන්තුව තුලින් බිහිකිරීමේ අරමුණින් නිලධාරි/ සෙසුනිළයන් 1200 සහභාගිත්වයෙන් ප්‍රවීණ මනෝවිද්‍යා උපදේශක චන්දන ගුණවර්ධන මහතා විසින් 2019.01.08 වන දින සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් ඉතා සාර්ථකව පවත්වන ලදී.

## රොෂාන් මහනාම සහ චමින්ද වාස් සමග සුහද පිළිසඳරක්





සිංහ රෙජිමේන්තුව තුලින් යහපත්, විනයගරුක හා ආකල්පයෙන් උසස් සෙබල පිරිසක් බිහිකිරීමේ අරමුණින් ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩකයින් වන රොෂාන් මහනාම සහ චමින්ද වාස් සමග ඔවුන් දෙදෙනා ජීවිතයේ ලබාගත් අත්දැකීම්, අභියෝග, පසුබෑසීම් හා තීරණගැනීම් පිළිබඳව සිංහ රණවිරුවන්ගේ ජීවිතයට ඵලදායී අයුරින් යොදා ගැනීම පිළිබඳව සුහද පිළිසඳරක් පැය 03 කට ආසන්න කාලයක් 2019.08.07 වන දින සිදුකරන ලදී.





## හැරවුමක ඇරඹුමක් යන තේමාව යටතේ අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීමේ පළමු වැඩසටහන

හැරවුමක ඇරඹුමක් යන තේමාව යටතේ අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීමේ පළමු වැඩසටහන සඳහා සහභාගිවූ දරුවන්ගේ ප්‍රගතිය සමාලෝචනය කර බැලීමට දින දෙකක නේවාසික වැඩසටහන ප්‍රවීණ මනෝවිද්‍යා උපදේශක චන්දන ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.





මනෝවිද්‍යා උපදේශණ සේවය ආරම්භ කරමින් එහි පළමු වැඩසටහන

[redacted]





විශේෂ දක්ෂතා දැක්වූ සිංහ විරුවන්ගේ දූදරුවන් හට ශිෂ්‍යත්ව ප්‍රධානය

විශේෂ දක්ෂතා දැක්වූ සිංහ විරුවන්ගේ දූ දරුවන් 75 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීමේ වැඩසටහන සේවාවනිතා ශාඛාවේ ගරු සභාපති තුමියගේ ප්‍රධානත්වයෙන් හා එය සම්බන්ධීකරණය කල සිවිල් සමාජ සත්කාරක සේවාවන් සිදුකරන ප්‍රසාද් ලොකුබාලසූරිය මහතා සහ ඔහුගේ ක්‍රියාකාරී සාමාජික/ සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් 2019.06.02 වන දින පවත්වන ලදී.




## හැරවුමක ඇරඹුමක් යන තේමාව යටතේ අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීමේ දෙවන වැඩසටහන




හැරවුමක ඇරඹුමක් යන තේමාව යටතේ අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීමේ දෙවන වැඩසටහන ප්‍රවීණ මනෝවිද්‍යා උපදේශක චන්දන ගුණවර්ධන මහතා විසින් 2019.08.27 වන දින සිට 2019.08.31 දින දක්වා නේවාසිකව පුරා දින 05 ක් සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිංහ රණවිරුවන්ගේ දූ දරුවන් 70 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථකව අවසන් කරන ලදී.





## කථිකයන් පුහුණු කිරීමේ වැඩසටහන

සිංහ නැණස යටතේ සිදුකරනු ලබන සුවිශේෂී වූ ක්‍රියාවක් ලෙස සිංහ කථිකයන් පුහුණු කිරීමේ වැඩසටහන ඉතාමත් සාර්ථකව ප්‍රවීණ කථිකයන් පුහුණු කිරීමේ දේශකයකු වන තිස්ස දිසානායක මහතා විසින් මේ වන විටත් සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල ක්‍රියාත්මක කරමින් පවතී

සිංහ නැණස මගින් සිදුකරන හැරවුමක ඇරඹුමක් වැඩසටහනට මා හට සහභාගි වීමට ලැබීම තුලින් අභියෝග ජයගනිමින් අනාගතය ජයගන්නේ කෙසේද යන්න මා හට අවබෝධ කර ගැනීමට හැකිවිය. ඔබත් එක්වන්න සිංහ නැණස සමග, මා මියගිය සෙ/31844 බනි 11 සේරසිංහ සීආර් රණවිරුවාගේ පුතණුවන් වන සීඑම් සේරසිංහ

සිංහ නැණස මගින් අරමුණකින් තොරව ගමන් කල මාගේ ජීවිතය හරිමගට ගෙන මා කථිකයෙකු කලා. ඔබත් එක්වන්න සිංහ නැණස සමග. මා සෙ/2ඊ02964 රසෙ බණ්ඩාර වයිපීජීඑන්

තිරසාර ආදායමක් සහ ස්වකීය සුභසාධන අවශ්‍යතා කළමණාකරණය කර ගැනීමට අවශ්‍ය ශක්තිය ලබාදීම උදෙසා ආබාධිත සෙබළුන් හා මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවරුන් බළගැන්වීමට සිංහ දිරිය ව්‍යාපෘතිය සිංහ සිංහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය වන ශිරෝමි මාසකෝරාල මැතිණියගේ සංකල්පයකට අනුව 2018ී09ී30 වන දින සිංහ රෙජිමේන්තුව වෙත හඳුන්වා දෙන ලදී




## මූල්‍ය කළමණාකරණය, සම්පත් කළමණාකරණය හා මූලික ගිණුම් තැබීමේ ක්‍රම පිළිබඳ වැඩසටහන

කුඩා කර්මාන්ත ක්ෂත්‍රයේ නියැලෙන යුද්ධයේදී තම ස්වාමිපුරුෂය මියගිය බිරින්දෑවරුන් සඳහා ඔවුන් හට අවශ්‍ය කරන මූල්‍ය කළමණාකරණය, සම්පත් කළමණාකරණය හා මූලික ගිණුම් තැබීමේ ක්‍රම පිළිබඳ දින 02 ක නේවාසික වැඩසටහන සම්පත් බැංකුවේ මූල්‍ය දායකත්වයෙන් ප්‍රවීණ මනෝවිද්‍යා උපදේශක චන්දන ගුණවර්ධන මහතා විසින් 2019.03.11 සහ 12 යන දිනයන්හිදී පවත්වන ලදී.




## ප්‍රවීණ ගායන ශිල්පිණී කොරීන් අල්මේදා ප්‍රමුඛ සංගීත කණ්ඩායම විසින් සංගීත ප්‍රසංගයක් පවත්වන ලදී

සිංහ නැණස සහ සිංහ දිරිය යටතේ සිදුකරනු ලබන ව්‍යාපෘතීන් සඳහා අරමුදල් රැස්කර ගැනීමේ අරමුණින් මීගමුව Grandeeza හෝටල් පරිශ්‍රයේදී 2019.07.21 වන දින ප්‍රවීණ ගායන ශිල්පි ඇනස්ලි මාලවන සහ ප්‍රවීණ ගායන ශිල්පිණී කොරීන් අල්මේදා ප්‍රමුඛ සංගීත කණ්ඩායම විසින් සංගීත ප්‍රසංගයක් පවත්වන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස හිටපු යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරල් මහේෂ් සේනානායක RWP RSP VSV USP USACGSC ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි වන ලදී.




# “සිංහ කැෆේ” නමින් අලෙවි මධ්‍යස්ථානයක්






ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාවනිතා ශාඛාව සුවිශේෂී වූ කඩඉමක් පසු කරමින් “Elsa” වෙළඳ සන්නාමය යටතේ ආබාධිත රණවිරුවන්ගේ හා රණවිරු බිරින්දෑවරුන්ගේ නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා “සිංහ කැෆේ” නමින් අලෙවි මධ්‍යස්ථානයක් 2019.09.10 වන දින කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයේ අඹේපුස්ස මංසන්දියේ යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මෙන්ම සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් MKD පෙරේරා RWP RSP VSV USP ndu ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ සහ සිංහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපති තුමියගේ සුරතින් විවෘත කරන ලදී.

පාවහන් නිෂ්පාදනය පිළිබඳව මා හට මූලික දැනුමක් තිබුනද සිංහ දිරිය මගින් ක්‍රියාත්මකවූ වැඩමුළුවලට සහභාගිවීම තුලින් පාවහන් නිෂ්පාදනයේ නව තාක්‍ෂණය පිළිබඳව දැනුම මා හට ලබාගැනීමට හැකි උනා. මා සෙ/364811 බනි 11 බටගල්ල බීආර්ජීආර්එච්

ස්වාමියා මියගියද දෙපයින් නැගීසිටීමට මට ශක්තියක් වුයේ සිංහ දිරිය ව්‍යාපෘතිය දැනට මා බෝනික්කන් සෑදීමේ නිරතව සිටින අතර මේ සඳහා සිංහ කැෆේ හරහා මා හට හොඳ වෙළඳපල ඉල්ලුමක් ලැබී ඇත. ඔබත් සිංහ දිරිය සමග අත්වැල් බැඳ ගන්නී මා මියගිය සෙ/31844 බනි 11 සේරසිංහ සීආර් රණවිරුවාගේ බිරිඳ වන සුධර්මා හෙට්ටිආරච්චි

# සිංහ අත්වැල

සිංහ රෙජිමේන්තු රාජකාරී කරනු ලබන. විශ්‍රාම ගොස් සිටින සිංහ රෙජිමේන්තුවේ සියළුම සාමාජිකයින් හට හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් හට පැනනගින ගැටළු නිරාකරණය කරගැනීම සදහා සිංහ රෙජිමේන්තුව තුලින් අත්වැලක් සැපයීම



වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙපිමේන්තුවට අනුයුක්තව 19 යාපනය මුහමළෙයි ප්‍රදේශයේදි ක්‍රියාන්විත රාජකාරියේ යෙදි සිටියදි පිවිතක්‍ෂයට පත් රණවිරු මා/සැරයන් බණ්ඩාර එස්එම්එන් යන ජ්‍යෙකොනොනිගේ ආදරණිය පුතණුවන් වන එසීඑම් ලසිත ඉමේෂ් මධුෂංක කෑගල්ල ශාන්ත මරියා මහා විද්‍යාලයේ අ:පො:ස (උ/පෙළ) හදාරන අතර ඔහු හට කොදුඇට පෙළෙහි සිදුකරන ලද ශෛලකර්මය සදහා රු:500000.00 ක මුදලක් පරිත්‍යාග කරන ලදි.

Elsa

ආබාධිත රණවිරුවන්ගේ සහ තම ස්වාමියා යුද්ධයේදී මියගිය රණවිරුවන්ගේ නිෂ්පාදන ණීඑල්සා□ වෙළඳ සන්නාමය යටතේ අලෙවි කිරීමේ අවස්ථාව ඔවුන් හට සලසා දී ඇතී


# සිංහ දිරිය පොත් ව්‍යාපෘතිය




# සිංහ දිරිය පාවහන් නිෂ්පාදනය




# සිංහ දිරිය විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය

# රණවිරු බිරින්දෑවරුන්ගේ ඇඟළුම් නිෂ්පාදන

# නොමිලේ මනෝ උපදේශණ සේවය

ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
ඉෂර්මා කාරියකරවන මහත්මිය
දු . අ :- 070 -4319151

මනෝවිද්‍යා උපදේශිකා සමීපා රාජපක්ෂ
මහත්මිය
දු . අ :- 070 -4319152

# රහසිගත ලෙන්ගතු සහයෝගය අපෙන්

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ ඉතිහාසය

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ ඉතිහාසය ගැන වර්තමානයේ කථිකා කරන්නේ නම් අතීතයෙන් බිදක් ආවර්ජනා කිරීම සඳහා මූලාරම්භය මෙසේ සනිටුහන් කරන්නෙමි. එදා ශ්‍රී ලංකාවට සැපැමිණි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ රාජකීය යුවලගේ දැඩි ආරක්‍ෂාව පතා මෙහි සපැමිණි හයිලන්ඩ් ලයිට් ඉන්පෙන්ට්‍රි (HILAND LIGHT INFANTRY) පාබල සේනාංකයේ නිලධාරීන් අප රාජ්‍යයේ සහ එදා පැවති ආරක්‍ෂක අංශවල සේවය ඉතාමත් ඉහලින් අගය කරන ලදි. ඔවුනගේ එක්තරා නිරීක්‍ෂණයක් වූයේ ලංකා යුද්ධ හමුදාවේ පාබල හමුදා බලශක්තිය ප්‍රමාණවත් නොවන බැවින් එය වැඩිකළ යුතු බව වේ. එය ඊට ප්‍රතිචාර දැක් වූ එදා ආරක්‍ෂක අමාත්‍යංශය මෙම අවශ්‍යතාවය අනාගතයට ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් බව අවිවාදයෙන් පිළිගත්හ.

මෙවැනි වකවානුවක අප රටේ මධ්‍යම පන්තියේ උගත් බුද්ධිමත් දේශපාලඥයින් රැසක් එක්වී බහුතර පොදු ජනතාව දැනුවත් කරමින් සඟ, වෙදි, ගුරු, ගොවි හා කම්කරු යන නමින් පංච මහා බලවේගයක් බිහි වූහ, මෙම බලවේගය මෙහෙය වූ ගරු එස් ඩබ් ආර් ඩි බංඩාරණායක ශ්‍රීමතාණන්ගේ නායකත්වයෙන් සමන්විත වූ නව රජයක් තුල ක්‍රි: ව: 1956 අප්‍රේල් මස 13 වන දින සිංහල භාෂාව රාජ්‍ය භාෂාව පිළිගන්නා බවත්, හෙළ සංස්කෘතිය විදහා දැක්මකට ශ්‍රී ලංකාව නමින් යොමුකරන බවටත්, පොරොන්දු වෙමින් රාජකීය මන්දිරයේදී එවකට ලකිසුරු පදවිය ඉසුලූ ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක එම්බීඊ නාමධාරි උතුමාණන් අභියසදී දිවුරුම් දුන්හ.

පෙර සඳහන් ඔවදන් පිළිගනිමින් නව රජය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පාබල ඒකකයක් ආරම්භ කිරීමට අනුමත කළහ. ඒ අනුව එවකට එම්බීඊ නාමධාරි මේජර් ආර්ඩි ජයතිලක භට නව පාබල ඒකකයක් ආරම්භ කිරීමට යුද්ධ හමුදාධිපති විසින් නියෝග කරන ලදි. එතුමා විසින් එංගලන්තයේ "ග්‍රීන් ජැකට් " රෙජිමේන්තුවේ ගති පැවතුම් සම්ප්‍රදායන් මුල් කරගෙන වර්ෂ 1956 ඔක්තෝබර් මස 01 වන දින නිලධාරි 04 දෙනෙකුගෙන් හා සෙබළුන් 22 කින් සමන්විතව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව නමින් දියතලාව එම්ප්‍රදෝරු කඳවුරේදී අප රෙජිමේන්තුව ආරම්භ වූ වගයි. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ ගමන් මග මින් ඉදිරියේදී වරින් වර පලවන "කූගර්" සඟරාවේ ඉඩ ලැබෙන අයුරින් කොටස් වශයෙන් පළ කිරීමට අදහස් කරමි. එතෙක් 2019 ජුනි මස 16 පොසොන් පොහෝදා පැවැත් වූ මෙතෙක් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ මියගිය ගරු සාමාජික මහතුන්ට පුණ්‍යානුමෝදනා කරමින් පැවැත් වූ මහා පිංකමේ ඡායාරූපයක් මෙහි පලකරනු ලැබේ.

**ඩිව් නෝර්මන් ඥාණපාල**
**සමාදන විනිශ්චයකාර දේශකීර්ති**
මේජර් (වි) ගරු ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු
සේවාමුක්ත භට සංගමය



## ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවාමුක්ත භට සංගමයේ

## සාමාජිකත්වයක් ලබාගෙන සිට මියගිය ගරු සාමාජික මහතුන් හට

## පිං අනුමෝදන් කිරීමේ මහා පුණ්‍යෝත්සවය

**පොසොන් පොහෝ දින**

**පිරිස්යාල සේනානායක මහා පිරිවෙන් විහාරස්ථානයේදී පැවැත්විනි**






# බළඇණි පුවත්

## 1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

1 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



2019.01.15 දින තෛපොංගල් උත්සවය වෙනුවෙන් ඒකක දෙවන අණදෙන නිලධාරී ඇතුලු නිලධාරීන් සහ රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සෙසුනිළ පිරිස එකතුව සියලු දමිළ ජනතාවට සුභපැතුම් එක් කිරීම සඳහා කොරක්කන්කඩ්ඩු ප්‍රදේශයේ පුල්ලෙයාර් කෝවිල වෙත පැමිණ උසස් අන්දමින් පූජාවක් පවත්වන ලදී.





2019.07.14 වන දින පරම වීර විභූෂණයෙන් පිදුම් ලද ලාන්ස් කෝප්‍රල් ගාමිණී කුලරත්න රණවිරුවාගේ ගුණානුස්මරණ දින වැඩසටහන සඳහා ආරක්ෂක සේනා මුලස්ථානය කිළිනොච්චිය ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ජ්‍යේෂ්ඨ නිලධාරී තුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, රණවිරු ලාන්ස් කෝප්‍රල් ගාමිණී කුලරත්න රණවිරුවාගේ වීර මාතාව ඇතුලු පවුලේ සාමාජික පිරිසක්ද මෙම උත්සව අවස්ථාව සඳහා එකතු විය.





ඒකක 63 වන බළඇණි සංවත්සර දිනයට සමගාමීව 2019.09.14 වන දිනය පුරා ඒකක අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කළ ලේ දන්දීමේ වැඩසටහන ඉතා සාර්ථක අයුරින් සිදු කළ අතර, ඒකකය අයත් 573 බළසේනා මුලස්ථානය යටතේ මෙන්ම 57 වන සේනාංකය යටතේ ඇති බෝහෝ ඒකකයන්හි නිලධාරි සහ සෙසුනිළ බොහෝදෙනෙකු මෙම අවස්ථාවට සහභාගී වි සිය දායකත්වය දක්වනු ලැබීය. තවද මෙම අවස්ථාව සාර්ථක කර ගැනීම වස් මෙහි පැමිණි කිළිනොච්චි මහරෝහලේ වෛද්‍යවරයා ඒකකයට මෙන්ම 573 වන බළසේනාංකයට විශේෂ ස්තූතියක් පුද කලේ අප බලාපොරොත්තු වුවාටත් වඩා රුධිර දායකත්වයක් අද දින ලැබුණු බව පවසමිණි.

# 4 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

4 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) වෙතින් ඒකක මට්ටමින් පැවති ආධාරක අවි තරගාවලියේ 4 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙනුවෙන් සහභාගී වූ කණ්ඩායම ප්‍රථම ස්ථානය දිනාගනු ලැබීය.





ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) වෙතින් ඒකක මට්ටමින් පැවති යුධ බාධක තරණය තරගාවලියේදී 4 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙනුවෙන් සහභාගී වූ කණ්ඩායම තෙවන ස්ථානය දිනාගනු ලැබීය





කුමාර් වීරසූරිය මහතාගේ ධන පරිත්‍යාගය සහ 4 ශ්‍රීලංසිරෙ ඒකකයේ සෙනීන්ගේ ශ්‍රම දායකත්වයෙන් යාපනය නෙල්ලිඅඩි ප්‍රදේශයේ පදිංචි තවනාද සෙල්වම් සරෝජනී මහත්මිය වෙත නිවසක් සදා දෙන ලදී.




ඒකකයේ අණදෙන නිලධාරී සංකල්පයකට අනුව ඒකකයේ සෙසුනිලයින් වෙනුවෙන් නව සෙසුනිල භෝජනාගාරයක් සාදා 2019.01.01 දින ලුතිතන් කර්නල් යූඑන්ජී කරුණාරත්න ආර්එස්පී පිඑස්සි අණදෙන නිලධාරී තුමා අතින් සෙසුනිල අයිතියට පත් කරන ලදී.



32 වන බළඇණි සංවත්සරය වෙනුවෙන් කොඩියට සෙත් පැතීම සදහා ආගමික වතාවත් සිදු කිරීම.



2019 වර්ෂයේ ජනවාරි මස ඇදහැලුණු ධාරාණීපාත වර්ෂාව හේතුවෙන් අවතැන් ජනතාව වෙත සහනාධාර බෙදාදිම සදහා අණදෙන නිලධාරීතුමන් සහ සෙසුනිලයින් සහභාගිත්වයෙන් සිවිල් ජනතාව හට සහනාධාර බෙදාදීම සිදුකිරිම.

32 වන බළඇණි සංවත්සරය වෙනුවෙන් ඒකකයේ පලමුවන අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ වත්මනයේ අම්පාර බුද්ධංගල ආරණ්‍ය සේනාසනයේ වැඩවාසි බුද්ධංගල ආනන්ද හිමි පාණන් වහන්සේ විසින් ධර්මදේශනාවක් පැවැත්වීම.





# 7 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

7 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





ආරක්ෂක සේනා මූලස්ථාන වන්නි ආඥාපති තුමාගේ උදාරතර සංකල්පයක් අනුව වව්නියාව දිස්ත්‍රික්කය තුල ජීවත්වන ඉතා අඩු ආදායම්ලාභි සිංහල පවුල් සදහා නිවස ඉදිකරදීමේ උදාරතර අරමුණ පෙර දැරීව වව්නියාව ප්‍රදේශයේ බෝගස්වැව ග්‍රාමයේ ඉඩම් අංක 2070 ඉඩමේ පදිංචි ආබාධිත දියණියක් සමග දිවිගෙවන කේවිඒ සරත් තිලකරත්න මහතා හට ප්‍රවීන ක්‍රිකට් ක්‍රිඩක රංගන හේරත් මහතාගේ මූල්‍ය ධන පරිත්‍යගෙන් 7 වන බළ ඇණිය ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි තුමා හා සියලුම නිලයන්ගේ ශ්‍රම දායකත්වයෙන් එම පවුල වෙනුවෙන් නිවසක් මාස 03 ක් වැනි ඉතා කෙටි කාල සිමාවක් තුල ඉදිකර 2019.09.10 වන දින යෙදි තිබුණු සුභ මෙහොතින් එම නිවැසියන් වෙත පිරිනැම්මී ඒ සදහා ආසේමු (ව) ආඥාපති තුමා වන මේජර් ජේනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පි යුඑස්පි එන්ඩිසි පිඑස්සි හා ප්‍රවින ක්‍රිඩක රංගන හෙරත් මහතා ඇතුලු නිලධාරින් හා ගම්වාසින් පිරිසක් එයට එක්ව සිටියහ.



ශ්‍රි ලංකා යුද්ධ හමුදාව විසින් උතුරු පලාතේ සිංහල ජනතා ව්‍යාප්ත කිරිමේ අරමුණ පෙර දැරි කරමින් වව්නියාව දිස්ත්‍රිකයේ වව්නියාව බෝගස්වැව ප්‍රදේශයේ සිංහල ජනතාව නැවත පදිංචි කිරිම් සිදු කරන ලදි. බෝගස්වැව ප්‍රදේශයට අයත් ගම්මානයක් වන සැලලිහිණිගම ගම්මානයේ ජිවත්වන අඩු අදායම්ලාභි පවුල් 85 ක් සදහා කොලඹ මොරටුව ප්‍රදේශයේ දානපතියෙකු වන රාමනායක ඔටෝ මොබයිල් ආයතනයේ අධිපති තුමාගේ ධන පරිත්‍යාගයෙන් සහ යුද හමුදා සංවිධානයෙන් මෙම ප්‍රදේශයේ ආර්ථික අපහසුතා ඇති පවුල් සහ ගැබිණි මාතාවන් සදහා වියලි සලාක මළු බෙදාදිම සිදුකරන ලදි. මේ සදහා බෝගස්වැව ප්‍රදේශයේ ස්ථානගතවි සිට 7 වන බල ඇණිය ශ්‍රි ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි තුමන්ගේ පුර්ණ අධික්ෂණය යටතේ බුදු පිලිම සහ වියලි සලකා මළු බෙදා දෙන ලදි.

7 වන බල ඇණිය ශ්‍රි ලංකා සිංහ රෙජිමේන්තු 1990.05.12 වන දින අඹේපුස්ස ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කර 2019.05.12 වන දිනට වසර 29 ක් පිරිම නිමිත්තෙන් වව්නියාව බෝගස්වැව යුධ හමුදා කදවුරේ බල ඇණි සංවත්සරය සමරන ලදී. වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඊඒයුඒ අමරසේකර ආර්එස්පි ජ්‍යෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් ආගම්කවතාවත්වලට මුල් තැනක් ලබා දෙමින් අණදෙන නිලධාරි තුමන්හට සම්මාන මුරයක්, අණදෙන නිලධාරි සුරතින් සදුන් පැලයක් රෝපණය කිරිම සියලු නිල සහභාගිත්වයෙන් තේ පැන් සංග්‍රහයක් සහ සියලු අයවලුන්ට සෙත් පතා බෝධි පුජාවක් පවත්වන ලදී









# 8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සෙබළුන් විසින් 2019.08.25 වන දින කෑගල්ලේ සිට බෙරගල දක්වා ඇති මාර්ගය දෙපස සුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් පවත්වන ලදි.





8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරී, ජ්‍යෙකොනොනි, කොනොනි සහ සෙසුනිලයින්ගේ ධන පරිත්‍යාග යෙන් කෑගල්ල ස්වර්ණ ජයන්ති ළමානිවාසයේ ළමුන් සදහා 2019.07.25 වන දින තේ පැන් සංග්‍රහයක් ලබාදීම.

8 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සෙබළුන් සහ සිවිල් ජනතාවගේ සහයෝගය ඇතිව 2019.09.10 වන දින සහ 11 වන දින කෑගල්ල බුලත්කොහුපිටිය ප්‍රදේශයේ රුක් රෝපණ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී.



# 9 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





ආරක්ෂ සේනා මුලස්ථානය මධ්‍යම හි උපදෙස් පරිදි යුද හමුදා සාමාජිකයින්ගේ ආගමික නැඹුරුව වැඩි කිරීමට හා මානසික ඒකාග්‍රතාවය වැඩිදියුණු කිරීමට මෙන්ම සමාජයට වැඩදායි සමාජ ශිලි පුද්ගලයින් බවට පත් කිරීමේ අරමුණ පෙර දැඩිව ඒකක සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්අර්කේආර් උඩගේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අධික්ෂණය යටතේ භාවනා වැඩ සටහනක් හා කෙටි ධර්ම දේශණාවක් පවත් වන ලදි.





9 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සියලු නිලධාරි/සෙසුනිලයින්ගේ ධන පරිත්‍යාගයෙන් හා ශ්‍රම දායකත්වයෙන් නවතමයෙන් ඉදි කරන ලද බළලත් නිලධාරි නිවස්න ගොඩනැගිල්ල ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්ආර්කේආර් උඩගේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් 2019.03.16 වන දින සුභ මොහොතින් විවෘත කරන ලදි.





2019 ජනවාරි 19 වන දිනට ඒකකය ස්ථාපිත කර වසර 26 ක් සපිරිම නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්ආර්කේආර් උඩගේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් සංවත්සර වැඩසටහන් කිහිපයක් සංවිධානය කර තිබුණි. ඒ අනුව සංවත්සර දින අණදෙන නිලධාරි හට කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන ආචාර පෙළපාලියක් පිරිණැමීම, අණදෙන නිලධාරි සියලු නිළ ඇමතිම හා සියලු නිල දිවාභෝජන සංග්‍රහයක් පවත්වන ලදි.

# 12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





ආසේමු (කිලි) පුහුණු සැලැස්මට අනුව 2018.11.01 වන දින සිට 2018.11.29 වන දින දක්වා අරසපුරකුලම් පුහුණු පාසලේ දී පවත්වන ලද පාබළ බණ්ඩ පාඨමාලාව සඳහා සහභාගි වූ 15(සෙවි) ශ්‍රී ලංසිරෙ කණ්ඩායම නිත්‍ය/ස්වේච්ඡා ඒකක 18 ක් වෙත ප්‍රබල අභියෝගයක් ලබා දී පාඨමාලාව සාර්ථකව හදාර ප්‍රථම ස්ථානය හිමිකර ගෙන ඇති අතර එමගින් ස්වේච්ඡා බළසේනාවට සහ ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තුව වෙත කීර්තියක් ගෙන දි ඇත.



12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිළධාරි සහ සෙසුනිළයින් සඳහා නවතමයෙන් ඉදිකරන ලද කායවර්ධන මධ්‍යස්ථානය 2018 දෙසැම්බර් 24 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒපී පල්ලාවෙල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් විවෘත කරන ලදී.





12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කොනොනි භෝජනාගාරය නවීකරණය සහ වායුසමනය කර 2018 මැයි 20 වන දින ගුවන් සංක්‍රමික බළසේනාධිපති කර්නල් එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් විවෘත කරන ලදී.

# 14 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



ආසේමු (මු) හි පැවති හොදම පෙළ තේරීමේ තරගාවලියේ හොදම ශාරීරික සුවතාවකින් හෙබි සෙබලා ලෙස 14 වන ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තුවේ සෙ/368770 කෝප්‍රල් උපාලි සෝමවීර පීජී ශ්‍රිලංකා යුද්ධ හමුදාධිපති තුමන්ගේ සුරතින් තමාට හිමි කුසලානය සහ සහතිකපත් ලබාගත් මොහොත.





14 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවෙ නවතමයෙන් ඉදිකරන ලද සිංහ ජන අවන්හල ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එස්ඩීබී දිසානයක ආර්ඩබ්පී පිඑස්සි විසින් 2019 සැප්තැම්බර් මස 05 වන දිනට යෙදුනු සුභ මොහොතින් විවෘත කරන අවස්ථාව.

# 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 11 වන බළඇණි සංවත්සරය නිමිති කොටගෙන මෙම ඒකක මූලස්ථාන කඳවුරේදී අති උත්කර්ෂවත් අන්දමින් 2019.07.28 වන දින පැවැත්වූ සංගීත ප්‍රසංගය හා ඒකක සංවත්සරය දිනය වෙනුවෙන් සංවත්සරය කේක් කැපීම හා විවිධ දස්කම් පෑ සෙබලුන් හට ඒකක අණදෙන නිලධාරි තුමන් විසින් සහතික පත් ප්‍රධානය කිරීම.







සෙසුනිල උසස් කිරීම් යටතේ බනි II, සැරයන් නිලයට හා කෝප්‍රල් නිලයට 2019.07.03 වන දින මෙම ඒකක අණදෙන නිලධාරී තුමන් විසින් නිල ලාංඡන පලඳවන ලදි.

# 20 වන මළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

20 වන මළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



මේජර් අයිජේ වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ උපදෙස් මත සියලු නිළයින් හට පිරිසිදු ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිකරන ලද ජල පෙරන යන්ත්‍රය.



අණදෙන නිළධාරි වශයෙන් රාජකාරි කළ මේජර් අයිජේ වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ උපදෙස් මත ඒකකයේ සියලු භටපිරිස් විසින් ඉදිකරන ලද සුභ සාධක වෙලද සංකීර්ණය 2018.06.06 වන දින බ්‍රිගේඩියර් කේඩීසීජීජේ තිලකරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් විවෘත කරන ලදි. (ජන අවන්හල, කරණවෑම්හල සහ තේපැන්හල)



අණදෙන නිළධාරි හට පිරිනැමු සම්මාන පෙලපාලිය



සියලු නිළ දිවා භෝජන සංග්‍රහය



පුරවසම්කුලම් සිට මල්ලාවි දක්වා ඇති මාර්ගය අලුත්වැඩියා කිරීම

# 21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව




2019.10.09 වන දින ඕමන්ත විදුහලේ ඉගනුම ලබන සිසු සිසු වියන් වෙත අභ්‍යාස පොත් ලබා දීම. මෙම අවස්තාව සදහා 56 සේනාංකාධිපති, 563 බලසේනාධිපති හා මෙම ඒකක දෙවන අණදෙන නිලධාරි සහභාගි විය.




2019.01.08 වන දින බෝගස්වැව විදුහලේ ලමුන් වෙත පාවහන් බෙදා දිම මෙම ඒකක අණදෙන නිලධාරි වන ලුතිනන් කර්නල් ටීබීඑම්ආර් කන්දේකුඹුර ආර්එස්පි යුඑස්පි හා 56 සේනාංකාධිපති මේජර් ජෙනරාල් දෙමටන්පිටිය යන ජෙෂ්ඨ නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.




වව්නියාව සැලලිහිණිගම පිහිටි මෙහෙණි ආරමයේ කොත පැලදවීම හා සඟගත දක්ෂිනාව ආරක්ෂක සේනා මුලස්ථානයේ එවකට වන්නි ආඥාපති එම්කේඩී පෙරේරා ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යුඑස්පි එන්ඩියු ජ්‍යේෂ්ඨ නිලධාරි තුමාගේ මග පෙන්වීම යටතේ 2019.01.20 වන දින සිදු කරන ලදි.




වව්නියා ජුම්මා මුස්ලිම් පල්ලියේදි පැවති පුජාව 2019.05.30 වන දින

# 23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



2019 අගෝස්තු මස පලමුවන දිනට යෙදී තිබූ 23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ දසවන සංවත්සරය වෙනුවෙන් ඒකක අණදෙන නිළධාරි මේජර් ඒඑම්එම්පිකේ මැදගෙදර ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ ප්‍රධානත්වයෙන් සැමරුම් වැඩසටහන් මාලාවක් පැවැත්විණි. අණදෙන නිළධාරි වෙත කදවුරු මුරයක් හා සම්මාණ පෙළපාලියක් පිරිනැම්ම ඒකකය යටතේ රාජකාරි කරනු ලබන සියලුම නිළයන්ගේ සුහදත්වය වර්ධනය කිරිමේ අරමුණින් පැවති ක්‍රිඩා තරග හා සියලු නිළ දිවා භෝජන සංග්‍රහය එදින ප්‍රධාන විය.

23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



මෙම පාඨමාලාව 2019 ජුලි මස 11 දින සිට 2019 අගෝස්තු මස 16 දින දක්වා ආපාදා කළමණාකරන පුහුණු පාසල - ගම්පොල වෙතින් පවත්වන ලදි. ඒහිදි 23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙතින් ඉදිරිපත් වු කණ්ඩායම සාර්ථකව පාඨමාලාව නිම කල අතර නි/70695 ලුතිතන් ජේපිඊස් ජයසුරිය යන නිළධාරී 4 වන ස්ථානයද සෙ/383722 රසෙ විජේරත්න ආර්පිජීඊස් යන සෙනි 2 වන ස්ථානයද ලබා ගනිමින් පාඨමාලාවේ සියලු අයවලුන් අභිබවා ජයග්‍රහණය ලබා ඇත.

23 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි වන මේජර් ඒඑම්එම්පිකේ මැදගෙදර ආර්එස්පි යන ජ්‍යෂ්ඨ නිළධාරිගේ ප්‍රධානත්වයෙන් 2019/09/20 දින රුක් රෝපණ වැඩසටහනක් පැවැත්විය.






# 24 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



මෙම ඒකක නවවන සංවත්සර දිනයට සමගාමීව නිළධාරි/සෙසුනිළයින් විසින් පවත්වනු ලැබු උත්සව කටයුතු



ආසේමු (මු) අඥාපතිගේ උපදෙස් පරිදි 59 සේනාංකාධිපතිගේ අධික්ෂණය යටතේ 2019 වර්ෂයේ ඒකක අතර පැවති පොසොන් කලාපයේදී මෙම ඒකකය වෙතින් පටාචාරා කතා වස්තුව නිර්මාණය කිරීමෙන් පසු දෙනව ස්ථානය දිනාගන්නා ලදි.



අණදෙන නිළධාරිගේ උපදෙස් පරිදි නවතමයෙන් ඉදිකරනු ලැබු රෙසැමේ නිළ නිවස්නය



2019 වෙසක් පෝහෝය නිමිති කොටගෙන ඒකකයේ අණදෙන නිළධාරිගේ ප්‍රධානත්වයෙන් පැවති බොධි පුජා පිංකම






## මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු නායකයෙකු වන කුමාර සංගක්කාර මහතා විසින් කරන ලද ආරාධනයකට අනුව ක්‍රියාන්විතයේදී රණක්ෂිතයට පත් රණවිරුවන් උදෙසා විශේෂ දිවා භෝජන සංග්‍රහයක් 2019.05.17 දින MINISTRY OF CRAB ආපණශාලාවේදී පැවැත්වූ අතර ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ භට පිරිස් ද ඒ සදහා සහභාගී වන ලදි.







ශ්‍රී ලංකාද්වීපයේ දශක තුනක පැවති යුද්ධයේදී තම මාතෘ භූමියේ භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කර ගැනිමේ පරම අභිලාශයෙන් සතුරා සමග අභිතව සටන් කර පූර්ණ අකර්මන්‍යතාවයට පත් වු රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් සිංහ සේවා වනිතා ගරු සභාපතිණි ශිරෝමි මාසකෝරාල මැතිණියගේ සංකල්පයකට අනුව රණවිරුවන්ගේ භට නිවාසය වායුසමීකරණය කර නවිකරණයෙන් පසු රෙජිමේන්තු මූලස්ථාන බලඇණියේ අණදෙන නිලධාරී මේජර් සි සුමනසේකර ආර්එස්පි යුඑස්පි ගේ ආරාධනාව පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්කේඩි පෙරේරා ආර්ඩබ්පී ආර්එස්වී විඑස්වි යුඑස්පි එන්ඩියු ගේ සුරතින් වර්ෂ 2019 ක් වු ජුලි මස 15 වන දිනට යෙදුනු සුභ මොහොතින් සෙබලුන්ගේ පරිහරණය සදහා විවෘත කල වගයි.

# 2 වන ස්වේච්ඡා බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ ඇති සේනාංක, බසේමු, ඒකක හා පුහුණු පාසල්හි රාජකාරී කරනු ලබන භටපිරිස්හි සහභාගීත්වයෙන් 2019 මාර්තු මස 15 හා 16 යන දෙදින තුළ මොණරාගල මහජන ක්‍රීඩාංගණයේදී පැවැති එල්ලේ තරගාවලියේ සමස්ත අනුශූරතාවය 2(සෙව්) ශ්‍රීලංසිරෙ ඒකකය විසින් හිමිකරගන්නා ලදී.





2(සෙව්) ශ්‍රී ලංසිරෙ බලඇණි පුහුණු පාඨමාලාව 2019 ජනවාරි මස 21 දින සිට 2019 මාර්තු මස 15 වන දින දක්වා ආසේමු (මධ්‍යම) බලඇණි පුහුණු පාසල වලමංඩිය වෙතින් නිලධාරීන් 09 දෙනෙකුගෙන් සහ සෙසුනිලයින් 310 කගේ සහභාගිත්වයෙන් සාර්ථකව හදාරන ලදි.





2(සෙව්) ශ්‍රී ලංසිරෙ බනි/සැර නිවස්නයේ ජ්‍යෙකොනොනින්ගේ නේවාසික පහසුකම් වෙනුවෙන් ඉදිකරන ලද නව දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර ජ්‍යෙකොනොනීන්ගේ ප්‍රයෝජනය සදහා ලබාදෙන ලදි.

# 3 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





3 වන බළ ඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත වසර 50 ක් සපිරීම හේතුවෙන් පසුගිය වර්ෂයන් වලදි මෙන්ම ඒකකයේ මියගිය/ආබාධිත රණවිරුවන් සහ රාජකාරි කරනු ලබන සියලුම නිළධාරි/සෙසුසනිළයින්, සිවිල් සේවක මහතුන් හට සෙත් පැතිම සඳහා දෙකටන, නාමළුව පුරාණ විහාරාධිකාරි ප්‍රණිධි පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල් විශ්වකීර්ති ශ්‍රී ධම්මභාණි ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද ගුවන් විදුලි, රූපවාහිණි විචිත්‍ර ධර්ම දේශක පුජ්‍ය පාද වෙන්නවත්තේ රතනජෝති හිමිපාණෝ කඳවුර වෙත වැඩම කරවා ධර්ම දේශනාවක් පවත්වන ලද අතර මේ සඳහා ඒකක අණදෙන නිළධාරි මේජර් ඩබ්ලිව්ඒච්එම් රණතිලක ශ්‍රිලංසිරෙ ජ්‍යේෂ්ඨ නිළධාරි ඇතුලු සියලු නිළධාරින් සහ සෙසුනිළයින් සහභාගි වන ලදි.



මෙම ඒකක 50 වන බළඇණි දිනයට සගාමීව මියගිය රණවිරුවන් සිහිකරමින් පවත්වනු ලබන පුෂ්ප උපහාර උත්සවය හා දානමය පිංකම.



3 වන ශ්‍රිලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරි තුමා වන මේජර් ඩබ්ලිව්ඒච්එම් රණතිලක ජේයෂ්ඨ නිළධාරි තුමා විසින් නවතමයෙන් ඉදිකර විවෘත කරන ලද සම්මාණ මුර පිඨිකාව.

මෙම ඒකක 50 වන බළඇණි දිනයට සමගාමීව නිළධාරි නිවස්නය වෙත ගෘහ භාණ්ඩ මිළදි ගෙන අලංකාර කිරීම හා බිම්මහල නවීකරනය කිරීම.





# 5 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

5 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



2019.04.01 දින කොනොනිගේ අභිවෘධිය වෙනුවෙන් නවතමයෙන් ඉදිකරන ලද කොනොනි සමාජ ශාලව විවෘත කිරීමේ අවස්ථාව.



2019.04.09 වන දින සෙසුනිළයින්ගේ අභිවෘදිය වෙනුවෙන් නවතමයෙන් ඉදිරිකරන ලද සෙසුනිළ භෝජනාගාරය විවෘත කිරිම.



2019.07.01 දින නවතමයෙන් ඉදිකරන ලද මුරහල විවෘත කිරීමේ අවස්ථාව.



2019.07.01 දින කල්‍යාණිපුර ගම්මානයේ සිවිල් ආබාධිත අයෙකු හට රෝද පුටුවත් පරිත්‍යාග කිරීමේ අවස්ථාව.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ ස්වෙච්ඡා ඒකක අතුරින් 5 එස් සංකල්පය ක්‍රියාත්මක කිරීමේ තරගාවලියෙන් තෙවන ස්ථානය දිනා ගැනීම.



කල්‍යාණිපුර ගම්මානයේ ආබාධිත අයවලුන් වෙනුවෙන් 2019 අගොස්තු මස 06 වන දින රෝද පුටු බෙදාදීම.

# 11 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව







11 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව අණදෙන නිලධාරි වන මේජර් ඊයුඩබ්ලිව්එන්සි ඇහැලේපොල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් සින්නවත්ත ශ්‍රී පන්ථාරාමයේ අභිනවයෙන් ඉදිකරන ලද ධාතු මංදිරය 2019 මාර්තු මස 19 වන දින විවෘත කරන ලදී.

11 වන ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් අඩු ආදායම්ලාභි පවුල් සදහා කාත්තන්කුඩි එම්සීඑච් හමීඩ් හාජියාර් භාරය විසින් සංවිධානය කල වියලි සලාක මලු 5000 ක ප්‍රමාණයක් බෙදාදීමේ වැඩසටහන 23 සේමු සේනාංකාධිපති මේජර් ජෙනරල් ඩබ්ලිව්ඒකේබී උදලුපොල ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් හා මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් ඊයුඩබ්ලිව්එන්සි ඇහැලේපොල ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සහභාගීත්වයෙන් 2019 ජුලි මස 25 වන දින බෙදාදෙන ලදී.









# 15 වන ස්වේච්ඡා බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව





2018.12.22 වන දින ඉරණමඩු ප්‍රදේශයට ඇදහැලුනු අධික වර්ෂාව හේතුවෙන් ඉරණමඩු වැවේ ජල පහරකට හසුවී ගසාගෙන ගිය වයස අවු: 22 ක් වන ආර් කේරල් හා වයස අවු: 22 වන ආර් ක්‍රිෂාන්තන් නමැති ප්‍රදේශවාසීන් දෙදෙනෙකු නිරපදිතව බේරා ගැනිමට 15(සෙව්) ශ්‍රීලංසිරෙ සෙනින් තිදෙනෙකු සමත් විය. මෙම ජීවිත ගලවාගැනීම සිදුකරන ලදිදේ සෙ/ඊ101333 රසෙ රණසිංහ ඒඒසීකේ, සෙ/22ඊ00180 ලාකෝ සමන් කුමාර ඒච්ච්එම්, සහ සෙ/15ඊ01313 කෝප්‍රල් ලයනල් කේඒ විසිනි.



ආසේමු (කිලි) පුහුණු සැලැස්මට අනුව 2018.11.01 වන දින සිට 2018.11.29 වන දින දක්වා අරසපුරකුලම් පුහුණු පාසලේදි පවත්වන ලද පාබළ ඛණ්ඩ පාඨමාලාව සඳහා සහභාගීවූ 15 (සෙව්) ශ්‍රීලංසිරෙ කණ්ඩායම නිත්‍ය/ස්වේච්ඡා ඒකක 18 ක් වෙත ප්‍රබල අභියෝගයක් ලබාදී පාඨමාලාව සාර්ථකව හදාර ප්‍රථම ස්ථානය හිමිකර ගෙන ඇති අතර එමගින් ස්වේච්ඡා බළසේනාවට සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු වෙත කීර්තියක් ගෙනදී ඇත.



2019.02.18 මුරුස මොටෙයි ග්‍රාමයේ සිවිල් වැසියන් හට සහනාධාර බෙදාදීම



2019.04.20 වන දින ඉරණමඩු වැවට මාළු මුදා හැරීම



11 වන බළඇණී සංවත්සරය නිමිති කොටගෙන අණදෙන නිලධාරී වන මේජර් කේපීඑන්එස්බී දිසානායක ගේ සුරතින් පැලයක් රෝපණය කිරීම.




ආසේමු වන්නි හි පැවති 2018 නව නිපැයුම් තරගාවලියේ පලමු වන ස්ථානය සෙ/ඊ101011 රසෙ රත්නායක ඩබ්පිටීසීඩී



අන්තර් සේනාංක පාපැදි තරගාවලියේ දී ප්‍රථම ස්ථානය මෙම ඒකකයේ සෙ/ඊ100022 රසෙ රූපසිංහ ආර්එස්එල්එම් යන සෙනියා විසින් දිනා ගන්නා ලදි.





ඒකක නි/සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද සුභසාධක වෙලද සැල අණදෙන නිලධාරී වන නි/5084 මේජර් කේපීඑන්එස්බී දිසානායක ගේ සුරතින් 2017/12/01 වන දින විවෘත කල මොහොත.

17 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

# යුගදිවිය රකින මුදු මොළොක් පිළිවෙත්

විවාහය ජීවිතයේ වැදගත් සන්ධිස්ථානයක් බව ඔබ මම අප හැමෝම දන්නා නුමුදු මේ වැදගත් සන්ධිස්ථානයෙන් පසු ජීවිතය පවත්වා ගත යුතු ආකාරය පිළිබඳව අප එතරම් අවධානයක් යොමු කරන බවක් දක්නට නැති අප බොහෝ විට හිතන්නේ පවුල් ජීවිතය එතරම් අරුමයක් නොවන බවයි. අපගේ මව්පියන් ඔවුන්ගේ පවුල් ජීවිතය ගත කළ ආකාරය බොහෝ විට මෙහිදී අප විසින් ආදර්ශයට ගනු ලබයි. එහිදී ආදර්ශමත් පවුල් ජීවිතයක් ගතකළ මවුපියන්ගේ දරුවන් එම ආදර්ශ තම පවුල් ජීවිතයට ඈඳා ගනිති. එසේ නොමැති පවුල්වල දරුවෝ ඔවුන්ට ලැබුණු අත්දැකීම් මත තම පවුල් ජීවිතය ගෙන යති. එහෙත් සැලකිය යුතු ප්‍රමාණයකට මෙම ආදර්ශ නිසි පරිදි ග්‍රහණය කර ගැනීමට අවකාශ ලැබුණ බවක් පෙනී නොයයි. එසේ කියනුයේ දිනපතා අපට හමුවන අඹුසැමියන් ජීවිතය දෙස බලන ආකාරය දුටු විටදීය. ඉතාම සුළු ගැටළු සාමකාමීව සන්සුන්ව විසඳා ගැනීමට ඔවුන් තුළ කුසලතා නැති බව පෙනී යන විටය. ජීවිත්වීමට ඉගෙන ගතයුතුය. විවාහයට පෙර විවාහ ජීවිතයටද එම න්‍යාය අදාළය.


කුඩා කාලයේ සිටම තම මවුපියන්ගේ ගැටුම් හැලහැප්පීම් දුටු සහ ඒවායේ අනිටු විපාක වලින් තම ජීවිතය පීඩාවට පත්වූ දරුවන් තම විවාහ ජීවිතයේ තීන්දු තීරණ ගැනීමේදී පමණක් නොව වගකීම් යුතුකම් ඉටුකිරීම් ආදියේදී පවා සෘජු සහ සමබර ලෙස කටයුතු කිරීමේ හැකියාවෙන් දුර්වල වෙයි. මෙහිදී සමාජයේ බොහෝ පිරිස් සෘජු පෞරුෂයි යනු කුමක්දැයි වටහා ගෙන නැති සෘජු පෞරුෂය යනු තමන්ට අන් අය සමග ගණුදෙනු කරන්නට සිදුවන විටදී තමාගේ පෞරුෂය ක්‍රියාත්මක වන ආකාරයකි. එහිදී සෘජු බව යනු තමාගේ මතය පැහැදිලිව අන් අයගේ සිත නොරිදවා ස්ථිරව කියා පෑමට ඇති ශක්තියයි. තමාට අවශ්‍ය දේ මෙන්ම අවශ්‍ය නොවන දේද, තමා බලාපොරොත්තු වන දේද, තම කැමැත්ත අකමැත්තද බොහොම සෞම්‍ය ස්වරූපයෙන් අනෙකාගේ ආත්මය සිදුරු නොකර ගරුත්වයකින් යුතුව කියන්නට ඇති හැකියාව සෘජු බවයි. එහෙත් සමහරු සෘජු බව යනුවෙන් අදහස් කරන්නේ තමාට අදහස් කරන දේ ඒ මොහොතේම තැන නොතැන නොබලා අන් අයගේ ආත්ම ගෞරවය, අභිමානය පිළිබඳව තැකීමක් නොකර ප්‍රකාශ කිරීමයි. "කට කෑවත් කියන්න ඕන දේ කියනවා" යනුවෙන් සමහරු උදම් අනන්නේ මෙම ලක්ෂණයයි. ඇත්තටම එය සෘජු බව නොවේ. එය රළු පුද්ගල ස්වභාවයයි. මෙම රළු ස්වභාවයෙන් තමා සතුටු වුවද අන්‍යයන්ගේ සිත බිඳී යයි.

පවුල් ජීවිතයකදී මෙවන් පැවැත්මක් දිගින් දිගටම ඇති වුවහොත් සහකරු, සහකාරිය පත්වන්නේ මහත් පීඩාවකටයි දෙදෙනාම රළු චරිත වූයේ නම් නිවසේ තත්වය නිතරම ගැටුම්කාරී වෙයි. දෙදෙනාට දෙදෙනා එපාවෙයි. වර්තමානයේ පවුල් ගැටළුවලට බොහොමයක් හේතු වන්නේ මෙවන් දේ පිළිබඳව අවබෝධයක් නොමැතිකමටත් වඩා ඒ පිළිබඳව ඇති නොසැලකිල්ලයි. තම සහකරු සහකාරියද ගරුත්වය අභිමානය ලැබිය යුතු බව අමතක කිරීමයි. පවුල් ජීවිතයට පමණක් නොව අපගේ සමාජ ජීවිතයට පවා මුදු මොළොක් වචන භාවිතා කිරීම ඉතා වටිනා සදාචාර ගුණයකි. අපි සැවොම අනෙකාගෙන් ගරුත්වය ලැබීමේ ආශාව ඇත්තන් වෙමු. එම ගරුත්වය ප්‍රදානය කරන ප්‍රධානම හැසිරීම නම් වචන භාවිතයේදී අප දක්වන සුබනම්‍ය විළාසයයි. සැරපරුෂ වදන් භාවිතය නිතර විධානාත්මක ඇමතුම් කිරීම මගින් ඉටුකර ගත නොහැකි බොහොදේ ආදරණීය එක් ඇමතුමකින් කරගත හැකි බව බොහෝ යුවතිපතීහු නොදනිති. එමනිසා නිරන්තරයෙන් ගැටුමකින්ම අදහස් මුදුන් පමුණුවා ගැනීමට උත්සහ කරති. එය ඔබේ දරුවන්ටද බෝවී ඔවුන්ගෙන්ද එම කර්කශ ස්වභාවය ඔබ අත්විඳිනවිට ඔබ පත්වන අසීරුතාවට හේතුව ඔබම බව වටහා ගන්නා විට ඔබ වැරදි මාර්ගයක බොහෝදුර ඇවිත් බව ඔබට දැනේවි. එමනිසා හැමවිටම කෙතරම් අසීරු මොහොතකදී වුවද පවුල තුළත් ඉන් පිටත් මියුරු ලෙස කතාකරන්නට උත්සහ ගන්නි ඉන් ඔබට අත්වන වාසි ඔබම අත්විඳින්නි එසේම තාක්ෂණික බද්ධ ජීවිත ගෙවන්නන් දිනෙන් දින පවුල සමග මිනිසුන් සමග ගණුදෙනු කිරීම, අන්තර් ක්‍රියා කිරීම, සම්බන්ධතා පැවැත්වීම පසෙක දා තාක්ෂණික උපාංග සහ උපකරණ සමග බැඳී සිටීම නිසාද ගැටළු සාදා ගනී. වර්තමානයේ බොහෝ පුද්ගලයන් විශේෂයෙන් තරුණ පරම්පරාව පමණක් නොව අඹුසැමියන්, පෙම්වතුන් පවා ඔවුනොවුන් සමීපව සිටින විටත් ඔවුනොවුන් අතර සංවාදයන් කිරීමට යොමුවීමට වඩා ජංගම දුරකථනයට, පරිගණකයට, රූපවාහිනියට වැඩි තැනක් ලබාදෙන බව දක්නට ඇතී ඒ පිළිබඳව බොහෝ මැසිවිලි උපදේශනයේදී බොහෝ සැමියන්ගෙන්ද බිරියන්ගෙන්ද නැගෙ යි. එසේම මේ චර්යාව නිසා නිවස තුළ ඔවුනොවුන්ගේ ඈත්වීමක්ද උපදේශනයේදී ගැටළුවක් ලෙසින් අපට හමුවෙයි.

දරුවන්ද මේ වැරදි පුරුදු ග්‍රහණය කරගැනීමත්, මවුපියන් ඒ සඳහා අවැසි උපාංග දරුවන්ට සැපයීමත් නිසා කුඩාකළ සිටම දරුවෝද මෙම උපාංග සමග ගණුදෙනුකිරීමට යොමු වී පුද්ගල අන්තර්සම්බන්ධතාවලින් ඈත්වෙති. දරුවන් වැඩෙන විටදී ඔවුන්ද මව්පියන්ගෙන් ඈත්ව තාක්ෂණික උපාංග සමග තමන්ගේ ලෝකවල ජීවත්වන බව වර්තමාන මවුපියන්ගෙන් නිතර කියවෙන මැසිවිල්ලක. මෙමගින් ඇතිකරන කායික මානසික ගැටළු රාශියකි. එය ක්‍රමක්‍රමයෙන් ඇතිවන නිසා එහි හානිය වැටහෙනවිට ප්‍රමාදවී ඇති බව කිව යුතුය. එසේම මිතුරු මිතුරියන් හමුවූ විට පවා සතුටු සාමීචියට විහිළු තහළු වලට වඩා කිසියම් හුදකලා කෝණයකට වී ජංගම දුරකථනය සමග ගණුදෙනුවක වෙළී සිටීම වර්තමානයේ සුලබ දර්ශනයක් වී ඇතී පසුගිය දිනක සාදයකට ඇරයුම් ලැබූ මා හිතවතියක ඉතා වැදගත් යමක් මා හමුවෙ තැබුවාය. එනම් සාදයට ඇතුළුවන පරිශ්‍රයේදීම ඔවුන්ගේ ජංගම දුරකථන බාරගෙන ආපසු යනවිට නැවත ලබාදුන් බවයි. මේ නිසා බොහෝ දෙනා මුලදී ඈලි මෑළි ස්වරූපයෙන් සිටියත් පසුව කතා බහ කරන්නට පටන් ගත් පසු ඉතා මිහිරි වාතාවරණයක් විනෝදකාමී බවක් සාදය තුළ දිස්වුන බවත් මත්පැන් සහ දුරකථන නැති සාදයක් බොහෝ කාලයකින් අත්දකින්නට හැකි වූ බවත්ය. ඉතිං මෙවැනි තාක්ෂණික මිනිසුන් බහුල වන විට මෙවන් ආකාරයේ සාද සංකල්ප මතුවීම අරුමයක් නොවේ. මා ඔබට කියන්නට උත්සහ ගන්නේ අප මෙබඳු පරිවර්තනයන් අපගේ ජීවිත තුළ පවත්වා ගැනීම නිසා අපටත් අපගේ සමීපතමයන්ටත් පීඩාකාරීවන බවයි. ජීවිතය ඒකාකාරීවන බවයි. එවිට අපි එයින් මිදීම සඳහා විවිධාකාරයේ චර්යාවන්ට යොමුවීමට උත්සහ කරයි. නමුත් වඩා සුදුසුම දෙය නම් ජීවිතය ඉගෙනීමයි. දැනගෙනම විවාහයට පිවිසීමයි. හැම දෙයකටම වඩා මනුෂ්‍යයා මනුෂයයන් සමග පවත්වන ප්‍රිය සමාගම ඔහුගේ කායික මානසික සුවයට වැදගත් බවයි. එමනිසා ජීවිතයේ දෙවන උපත බඳු විවාහට ඇතුළු වීමේදී ඒ පිළිබඳව ඉතා හොඳින් දැන ඉගෙන ගෙන පිවිසෙන්නී එවන් ඉගෙනුමකින් පසු විවාහයට පිවිසෙන ඔබට, ඔබගේ සහකරු සහකාරිය සමග තෘප්තිමත් ප්‍රීතිමත් දිවිගමනක් ගත කිරීමේ අවස්ථාවක් ඔබට ලැබේවි. ඔබෙන් උපදිනා පරපුර ප්‍රීතිමත් පරපුරක් වේවි. මානව සබඳතා පිළිබඳ විශ්වාසය ඇති වේවි. අන්තිමට ඔවුන් ලෝකයට ආදරය කරන ලෝකය රකින මනුෂ්‍යාට ගරුකරන පරපුරක් වේවි. අප ඉපැයූ අන් හැම දෙයටම වඩා මහඟු වටිනා නිධානයක් ලෝකයට ඉතිරි කර තබා සතුටින් නික්ම යන්නට හැකිවේවි. ආදරය කරන්න. විවාහය ගැන දැනුවත් වන්න. ඉගෙන ගන්න. මිනිසුන් සමග පවත්වන අන්තර් පුද්ගල සම්බන්ධතා වැඩි කරන්න.

ජ්‍යෙෂ්ඨ මනෝ උපදේශිකා
එෂාමා කාරියකරවන

# ග්‍රන්ථ විචාරය හා පුස්තකාල පරිශීලනයේ ඇති වැදගත්කම



ග්‍රන්ථ විචාරය යනු අප පරිශීලනය කරනු ලබන ග්‍රන්ථයක් කියවා එහි කතාපුවත කෙටියෙන් සාරාංශගත කිරීමයි. මෙහි වැදගත් කම නම් සම්පූර්ණයෙන්ම අදාල ග්‍රන්ථය කියවීමට අවශ්‍ය වන්නේ නැත. සාරාංශය තුලින් ඒ පිළිබද හොද අවබෝධයක් ලබාගැනීමට හැකිවනවා සේම විචාර බුද්ධිය ඉහළ නංවාගත හැක.

ඉතිහාසය හා වර්ථමානය දෙස බලන විට පෙර තිබූ මන්දගාමී ස්වභාවය වෙනුවට සීඝ්‍රගාමී සංවර්ධනයක් දක්නට ලැබේ. එවැනි සංවර්ධනයක් දක්නට ලැබුනද සදාචාර සම්පන්න පරිසරයක ජීවත්වන අප නවීකරනය හා සන්නිවේදනය තුලින් ඉහලට ගමන් කලද සංස්කෘතික වශයෙන් පසුබෑමකට ලක්වී ඇති බැව් දක්නට ලැබේ. ශ්‍රී ලංකාව තුල ලේඛණ කලාව බිහිවීමත් සමගම විවිධ මාතෘකා හා විවිධ සිද්ධීන් පදනම් කරගෙන විවිධාකාර කෘති එළිදැක්වීම හා විචාර පර්යේෂකවරු බිහිවීම සීඝ්‍රයෙන් සිදුවිය. වර්තමානය වනවිට ලේඛණ කලා හුදකලා වෙමින් විචාර පර්යේෂකවරු බිහිවීම අඩුවී ඇත. තාක්ෂණය මුල් කරගෙන පුස්තාකාල පරිශීලණය ද අවම වී ඇත.

අද සමාජය පුස්තකාල පරිහරණය කිරීමට අපොහොසත් වී ඇත. විවිධ මාතෘකා යටතේ පොත්පත් විශාල වශයෙන් යම් යම් මාතෘකා හා සිද්ධීන් මූලික කරගෙන සමාජයට එළිදක්වා ඇත. ආගමික සංස්කෘතික හා සමාජීය වශයෙන් පොත්පත් ලියවී ඇති අතර පරිසර මෙන්ම විවිධ ශ්‍රේෂ්ඨ පුද්ගලයින් ගැනද විස්තර ඇතුළත් පොත්පත් ලියවී ඇත. පුස්තකාල පරිහරණයේ ඇති වැදගත් කම නම් අප නොදන්නා කරුණු රාශියක් පිළිබද දැනුමක් ලබාගත හැක. ශ්‍රේෂ්ඨ පුද්ගලයින් පිළිබදකව තොරතුරු දැනගැනීම මෙන්ම පාරිසරික තොරතුරු හා විවිධ රටවල් පිළිබදව විශාල වශයෙන් දැනුමක් ලබාගත හැක. පොත්පත් පරිශීලනය තුලින් හා ඒවා විචාරය තුලින් අධ්‍යපන කටයුතු ඉහල නංවා ගත හැකි අතර තාර්කික බුද්ධිය වර්ධණය කර ජීවිතය ගොඩනංවා ගැනීමටත් සමාජය තුල යහපත් මිනිසෙක ලෙස නිර්මාණය වීමට පුස්ථකාල පරිශීලනය කිරීම මහත් උපකාරයක් වනු ඇත.

සෙ/367735 කොප්‍රල් නානායක්කාර එස්ආර්
1 ශ්‍රීලංසිරෙ
පුහුණු අංශය රෙමශ්‍රීලංසිරෙ

# ආදරණීය දෙමාපියනි ඔබගේ දරුවා සුරක්ෂිතද ?

ලෝකයේ වටිනාම සම්පත ලෙස පිළිගන්නේ දරුවන්ය. හොඳම දෙය ලැබිය යුත්තේ ද දරුවන්ටයි් අනාගතය භාර ගැනීමට සිටින මල් කැකුළු වන් ළමා පරපුර ආරක්ෂා කරගැනීම වැඩිහිටි හැම දෙනාගේම වගකීමකි. එසේම දරුවන් වෙනුවෙන් කටයුතු කරන විවිධ ආයතනද ඕනෑ තරම් ඇතී එසේ වුවද දිනෙන් දිනම අහිංසක දරු පැටවුන් හට සිදුවන අපරාධ වල වැඩිවීමක් ද දක්නට ඇත.

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18 කට අඩු තැනැත්තෙකු ළමයෙකු ලෙස පිළිගනු ලැබේ එසේම “1989 ලෝක ළමා ප්‍රඥප්තියේද’’ අවුරුදු 18 ට අඩු අයෙකු ළමයෙකු ලෙස පිළිගෙන තිබේ මෙම පිළිගැනීමට ද ශ්‍රී ලංකාව 1991 වසරේ එකඟ වී ඇතී ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක වීමේදී යම් යම් අවස්ථා වලදී ළමයාගේ වයස වෙනස් වන අතර පොදුවේ ගත්කල ඉහත සඳහන් පරිදි වයස අවුරුදු 18 ට අඩු අයෙකු ළමයෙකු ලෙස පිළිගනු ලැබේ.

අද වන විට ශ්‍රී ලංකාවේ ළමුන්ට එරෙහිව සිදුවන අපරාධ දෙස බැලීමේ දී වැඩි වශයෙන්ම ශාරීරික වශයෙන් ඔවුන්ට සිදුවූ අපරාධ පෙනෙන්නට ඇතී පහරදීම්, වදහිංසා වලට අමතරව ඉතාමත් දරුණු ලෙස ලිංගික අපයෝජනවලට දරුවන් ලක්වීම නිරන්තරයෙන්ම දක්නට ඇතී ළමා කාලය තුළ ළමයෙකු දිගින් දිගටම ලිංගික අපයෝජනයට ලක්වීම හේතුවෙන් සිදුවන මානසික අපයෝජනය නිසා එම දරුවන්ගේ සමස්ථ ජීවිතයම අවාසනාවන්ත ලෙස විනාශ වී යාමට හේතුවනු ඇතී බොහෝ විට විවිධ අපරාධ වලට හුරුවූ අපරාධකරුවන් පිළිබඳව පසුවිපරම් කර බැලීමේ දී ඔවුන් ළමා කාලය තුළ විශේෂයෙන්ම මුල් ළමා විය ගතකරන කාල පරිච්ඡේදය තුළ විවිධ අපරාධ වලට ගොදුරු වී ඇති බවට අනාවරණය වී ඇතී ළමා කාලය තුළ දී එම දරුවන් ආරක්ෂා කරගැනීම සම්බන්ධව දෙමවුපියන්ට හා වැඩිහිටියන්ට නිසි දැනුමක් තිබුනේනම් එම අපරාධකරුවන් එම තත්වයට පත් නොවී අද වන විට ශ්‍රී ලංකාවට වැඩදායී පුරවැසියන් කිරීමට හැකියාව තිබුණි.

බොහෝ වැඩිහිටියන්ගේ ආකල්පය වන්නේ මෙම ලිංගික අපයෝජනයන්ට ලක්වන්නේ ගැහැණු දරුවන් බවයී එහෙත් මේ වන විට වාර්තා වී ඇති ළමා අපරාධ දෙස විමර්ශනාත්මකව බැලීමේ දී බරපතල ගණයේ ලිංගික අපරාධ සඳහා වැඩි වශයෙන් ගොදුරු වන්නේ පිරිමි දරුවන්යී ගැහැණු දරුවන් සිටින මවුවරු පියවරු ඔවුනට බොහෝ සෙයින් අවධානය යොමුකර සිටින අතර පිරිමි දරුවන් සිටින දෙමාපියන් එසේ වැඩි අවධානයක් යොමු නොකරයී එසේම ලිංගික අපයෝජනය සඳහා ගොදුරු වන්නේ වයස අවුරුදු 15ත් 18ත් අතර වයසේ දරු දැරියන් බව සිතා සිටියද ඉතා කුඩා දරුවන්ද දරුණු ලිංගික අපයෝජනවලට ගොදුරු වූ අවස්ථා වාර්තා වේ බොහෝ විට මෙම දරුවන් මෙම අපයෝජනවලට යොදවා ගත් පුද්ගලයින් දරුවාට සමීප සබඳතා ඇති හෝ වෙනත් සබඳතා ඇති පුද්ගලයින් බවට නිරීක්ෂණය වී ඇත.

ශ්‍රී ලංකාවේ පවත්නා නීතියට අනුව වයස අවුරුදු 16 ට අඩු ගැහැණු  දරුවකු  විසින් හෝ පිරිමි දරුවකු විසින් ලිංගික ක්‍රියා සඳහා ලබාදෙන කැමැත්ත කැමැත්තක් ලෙස පිළි නොගන්නා අතර එවැනි දරුවෙකු ඒ සඳහා යොදවා ගත් පුද්ගලයෙකු හට මහාධිකරණය මගින් නඩු පවරා වසර 20ක් දක්වා බන්ධනාගරගත කිරීමකින් දඩුවම් ලැබෙනු ඇතී බොහෝ විට  අවුරුදු 14 සහ 15 වැනි වයසේ පසුවන දැරියන් තමන්ගේ ප්‍රේම සබඳතාව මත කැමැත්තෙන්ම ප්‍රේමවන්තයා සමඟ ලිංගික කටයුතු වල යෙදීම ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය ලෙස පිළිග න්නා අතර 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනතේ 363 වන වගන්තිය යටතේ සැකකරු වරදකරු වන අවස්ථාවකදී මහාධිකරණය මගින් ඉහත දැක්වූ පරිදි වසර 20 ක් දක්වා බන්ධනාගාරගත කිරීමකින් දඩුවන් ලබාදිය හැක.

කෙසේ වුවද අපයෝජනයට පත්වන විවිධ දරුවන් දෙස බැලීමේදී අනාරක්ෂිත දරුවන් මේ සඳහා වැඩි පෙළඹවීමක් ඇති බව පෙනී යයි. විදේශ ගතවූ දෙමවුපියන්ගේ දරුවන්, වෙනත් භාරකාරත්වයේ සිටින දරුවන්, වීදි දරුවන්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් බොහෝ විට වින්දිත වීමේ ප්‍රවණතාවයක් ඇති අතර මව සහ පියා දෙදෙනාම සිටියද නිසි පරිදි ළමයාගේ ආරක්ෂාව පිළිබඳ නොබැලුවහොත් අවසනාවන්ත ලෙස ළමුන් මේ සඳහා ගොදුරු වීමට ඉඩ ඇත.

මනෝජ් සමරසේකර
ස්ථානාධිපති මහජන සම්බන්ධතා හා පුහුණු
ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශ මූලස්ථානය

# භූ දේශපාලන විමසුම

පැරණි සේද මාවත පුනර්ජීවනය (One Belt One Road) චීනය සතු අවස්ථා අභියෝග සහ අවදානම : ශ්‍රී ලංකාව විශේෂ අවධානයකට ගෙනි. එක් තීරයක් එක් මාර්ගයක් (OBOR) මෙම ශත වර්ෂයේ ලබාගත් යෝධ ආයෝජන සැලැස්මක් ලෙස හැඳින්විය හැක. එහි මූලික ලෙසම කෙටි හා දිගු කාලීන අරමුණු ඇතිව වත්මන් චීන ජනපති ෂී ජින්පින් (Xi Jinping) මහතා විසින් ආරම්භ කරන ලදි. කෙසේ වෙතත් විරුද්ධවාදීන් මෙය හඳුන්වනුයේ සම්ප්‍රදායික සතුරන් මෙල්ල කිරීම සඳහා ලබාගන්නා ලද ආර්ථික උපාය මාර්ග යක් ලෙසයි. කෙසේ වෙතත්, චීන රජය ඉතා යුහුසුළුව මෙම ව්‍යාපෘතියට මූලිකත්වය ලබා දුන්නේ අතිරික්ත ප්‍රාග්ධනය ඉදිකිරීම් ධාරිතාව විදේශීයව ආයෝජනය/අපනයන සංවර්ධනය, දුරස්ථ ප්‍රදේශ සංවර්ධනය, චීන මුදල් ඒකකය ගෝලීයකරණය, ගුණාත්මක අපනයන භාණ්ඩ නිෂ්පාදනය, බැඳුම්කර වෙළඳාම තුළින් වාසි ලබා ගැනීම යනාදියයි. පවත්නා සැලැසුම් එසේ වුවද එහි බලපෑමට සෑම විටම ධනාත්මක නොවනු ඇත. එනම් මූල්‍ය, දේශපාලනය, ආරක්ෂණ ණය සහ මෙහෙයුම් අවදානම් ඉතා අවිනිශ්චිත වන අතර මේ සඳහා චීන රජය විශ්ලේෂක පිවිසුමක් ලබාගෙන ඇති නමුත් ක්‍රියාවට නැංවීමේදී ඇති අපහසුතාවයන් විචල්‍ය විය හැක.

මෙම විශාල ප්‍රාග්ධන ව්‍යාපෘතියේ මූල්‍ය අරමුණ ආසියාව, මැදපෙරදිග, අප්‍රිකාව හා යුරෝපය ගොඩබිම් ප්‍රවාහනයෙන් සම්බන්ධ කිරීම තුළින් තිරසාර ආර්ථික හා මානව සංවර්ධනයක් ලඟාකර ගැනීමයි.

චීනය අරමුණ කරගන්නා ගෝලීය ආර්ථික වාසි තත්ත්වය තුළින් භූ දේශපාලන වාසිය ලබාගැනීමට මතුපිටින් සාර්ථක ලෙස පෙනුනත් පුළුල් සර්ව ආර්ථික ව්‍යුහයෙන් බලන කල ගිවිසුම්ගත පාර්ශවයන් වන අන් රාජ්‍යයන් වෙතින් වන බලපෑමද සුළු කොට තැකිය නොහැකි මේ වනවිටත් විදේශ රාජ්‍යයන් 65ක් මෙම ව්‍යාපෘතිය සඳහා ඔවුන්ගේ දායකත්වය ස්ථිර කර ඇත. ශ්‍රී ලංකාව මෙම ව්‍යාපෘතිය ආරම්භයේදීම සහභාගීත්වය ස්ථිර කරමින් බහුවිධ යෝජනාවලට ඇතුළත් වන ලදී.

මෙම ව්‍යාපෘතියේ මූලික කාර්ය සාධන සැලැස්ම 2015 මාර්තු මස 28 වන දින චීන ජාතික සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ කොමිසම චීන රජයේ විදේශ අමාත්‍යංශය හා වාණිජ අමාත්‍යංශය අත්වැල් බැඳ ගත් අතර එම සම්මන්ත්‍රණයේදී මූලික සැලසුම සේද මාවතේ ආර්ථික තීරය ගොඩනැගීම සහ විසිඑක්වන ශතවර්ෂයේ නාවික සේද මාවත ලෙස නම් කරනු ලැබීමය. මෙහි ආර්ථික තීරයන් ප්‍රදේශ පහත පරිදිවේ.

චීනය - මධ්‍යම ආසියාව - රුසියාව - යුරෝපය (බෝල්ටික් කලාපය)
චීනය - මධ්‍යම ආසියාව - බටහිර ආසියාව - පර්සියානු ගල්ෆ් කලාපය - මධ්‍යධරණී මුහුද
චීනය - ආසියා ශාන්තිකර කලාපය - දකුණු ආසියාව - ඉන්දියානු සාගරය 21 වැනි ශතවර්ෂයේ නාවික සේද මාවත පහත දක්වා ඇති මුහුදු කලාප හරහා දිස්වනු දැකිය හැක
චීන වෙරළ - දකුණු චීන මුහුද - ඉන්දියානු සාගරය - යුරෝපය
චීන වෙරළ - දකුණු චීන මුහුද - දකුණු පැසිෆික් මුහුදු කලාපය

මෙය ප්‍රධාන ලෙස බටහිර රාජ්‍යයන් විසින් නිර්වචනය කරනු ලබන්නේ "චීන මාෂල් සැලැසුම" ලෙසයි මෙය නැගෙනහිර චීනය සහ බටහිර චීනය අතර ඇති සංවර්ධන විෂමතාවය ඇතිකිරීමයි මෙය බටහිර බලවතුන් පශ්චාත් දෙවන ලෝක යුධ සමයේ ඇමෙරිකාව විසින් බටහිර යුරෝපය සංවර්ධනය සඳහා ආධාර අනුබල දීමට සමාන කර තිබේ.

මෙම ව්‍යාපෘතිය තුළින් චීනයේ පළාත් අතර ඇති අසමානතාවය අවම කිරීම චීන කර්මාන්ත නගාසිටුවීමට එකතු කළ අගයන් සහිත අපනයන සංවර්ධනය 2008 ගෝලීය ආර්ථික අර්බුදය අවස්ථාවේ අඩුම්ලට නිපදවූ අතිරික්ත ගොඩනැගිලි ද්‍රව්‍ය විදේශීය ආයෝජනය, හුවමාරු සහ බැදුම්කර අලෙවියෙන් වාසි ලබාගැනීම, චීනය සතු විශේෂ ආයෝජන තුළින් තරගකාරී වාසින් ලබා ගැනීමට ඇති අවස්ථා ඉහළ බව ආර්ථික විශේෂඥයන්ගේ මතයයි. මෙහි ඇති අභියෝග සහ අවදානම් ඒක ලෙස ගත් කළ ශ්‍රී ලංකාව ඉතාමත් සෘජු උදාහරණ සපයයි.

ව්‍යාපෘති ගිවිසුම් අවසන් කිරීමේ අවදානම, 2015 වසරේ දේශපාලන පෙරළියත් සමග චීනය සහ ශ්‍රී ලංකාව වරාය නගර නිර්මාණය අතරමග නවතා දැමීමට සිදු වූ අතර මෙවැනි ක්‍රියාමාර්ග තුළින් ප්‍රායෝගික ආයෝජනයන් දුබල වීමට, මූල්‍ය පිරිවැය වර්ධනයද දැකිය හැකි එසේම අප්‍රිකාව, බටහිර ආසියාව, වැනි දුර්වල රාජ්‍යයන් ආයෝජනය කිරීම තුළින් බලාපොරොත්තු නොවන ආර්ථික අවාසි සිදුවිය හැක.

**ආර්ථික අවදානම -**

ශ්‍රී ලංකාවට ආර්ථික සංවර්ධන දර්ශකයේ පහළින් තිබෙන දිළිඳු සහ මධ්‍යම ආදායම් රටවල් විශාල ප්‍රමාණයෙන් මෙම ව්‍යාපෘතිය සමඟ පුළුල් වුවත් බොහෝමයක් රටවල් අවශ්‍ය නොවන යුධ ගැටුම් / ආර්ථික බලපෑම් / අභ්‍යන්තර ගැටුම් වලින් පිරී පවතී මෙම තත්ත්වය වඩාත් ආවේගයෙන් පසුබැස්වීමට හේතු වේ.

**දේශපාලනික අවදානම -**

මෙම ව්‍යාපෘතිය සඳහා එකතු වී ඇති රාජ්‍යයන් බහුවිධ පක්ෂ දේශපාලන සංස්කෘතියක් ඇති රටවල් වන අතර පංති දේශපාලනයේ කෙටි හා මධ්‍යකාලීන අරමුණු දරන අතර පවතින ප්‍රතිපත්තීන් අවම මූලිකත්වයක් ගනු ලබයි. ශ්‍රී ලංකාවෙන් රාජ්‍යයක් මෙයට හොඳ උදාහරණ සපයයි. වසර 70 ක් පුරා ප්‍රධාන පක්ෂ 2 ක් වටා රාජ්‍ය බලය හුවමාරුව, දියුණු රාජ්‍යයන්ගේ බලපෑම මත හා දූෂිත දේශපාලඥයන්ගේ ක්‍රියා කලාපයද ව්‍යාපෘති අතරමග නැවැත්වීමට අදූරදර්ශී ආයෝජනද රට තුළට ගෙන ඒමද සිදුවේ.

**මෙහෙයුම් අවදානම -**

මධ්‍ය ආදායම් රටක් ලෙස ලේබල් ගසමින්, 2019 වසරේදී වසර 30 ක සිවිල් යුද ගැටුම් අවසන් කොට ආර්ථික අංශවල පුළුල් අවශ්‍යතා තිබියදීත් ලෝක ආර්ථික බුද්ධි දර්ශකවලට අනුව දේශපාලන අස්ථාවරභාවය හා අකර්මන්‍ය පාලනය දර්ශකයේ 60% ප්‍රතිශතයක් ගැනීමද ඉහළ අගයක් වේ. එමෙන්ම ජාතික ප්‍රතිපත්ති රටාවට දේශපාලන බලපෑමද, යටිතල පහසුකම් අවම වීම, ශ්‍රම වෙළෙඳපොළ අවදානමද ඉහළ අගයක් වේ. එසේම සම්පත් අවම වීම හා කුසලතා ඇති ශ්‍රමිකයන් අවම වීමද චීන ව්‍යාපෘති ශ්‍රී ලංකාව තුළ ඇස්තමේන්තු ගත පිරිවැයට වඩා වැඩි වීම ද සිදු වේ.

**ණය අවදානම -**

ණය ආපසු ගෙවීමේ අවදානම අතින් ශ්‍රී ලංකාවට ඉතා ඉහළ ස්ථානයක පවතී. ශ්‍රී ලංකාවේ අපනයන අංශයන් වෙත විදේශීය සම්බන්ධතා බලපෑම තුළින් ගෙවුම් ශේෂ වර්ධනයන් රාජ්‍ය ආදායම් අවමවීමත් ණය ආපසු ගෙවීමට ඇති අවස්ථා අවම කිරීමට හේතුවී තිබේ.

සියළු කරුණු කාරණා එක ලෙස ගත් කල චීනයේ මූලික ආර්ථික උපාය මාර්ගයන් සාර්ථක කර ගැනීමට ඇති අවස්ථා විශාල වුවත් කුඩා රාජ්‍යයන්ගෙන් සමන්විත බලපෑම් සුළුපටු නොවේ.

මේජර් ටීකේජී මඩවල පීඑස්සි එල්එස්සි
විධායක අධිකාරී - රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංසිරෙ

දැනුම මංපෙත

# PDF හිසරදයක් ද...?

කාර්යාලීය කටයුතු, පාඨමාලා කටයුතු හා තවත් වැදගත් බෙහෝදේ සදහා අපට මේවන විට නිතරම භාවිතා කිරීමට සිදුවී ඇත්තේ PDF Fromat ලිපි ගොනුය. ඉතින් මෙම මාදිලියේ ලිපි ගොනු භාවිතයේදී අපහාටත් සිදුවන අපහසුතාවය තමයි PDF Fromat ලිපි ගොනු නැවත සංස්කරණය කිරීමට අපහසු වීම. මම අද මෙම ලිපියෙන් හදුන්වා දෙන්නේ එම අපහසුතාවය මගහරවා ගෙන කටයුතු කිරීමට හැකි ගොඩාක් වටිනා මෘදුකාංගයක් ගැනය.

මෙම වටිනා මෘදුකාංගය Foxit Phantom PDF ය. මෙම මෘදුකාංගය භාවිතා කරල PDF ලිපි ගොනුවක් නැවත සංස්කරණය, පින්තූරයක් බවට හැරවීම (convert to image), ඉදිරිපත් කිරීමකට හැරවීම (convert to PPT), Word ලිපිගොනුවක් බවට හා තවත් නොයකුත්දේ පහසුවෙන් සිදුකිරීමේ හැකියාවක් ලබාදී ඇත.


### මෘදුකාංගය භාගත කිරීම.

පහත ඇති Link මගින් මෙම මෘදුකාංගය බාගත කරගත හැක.
http://www.mediafire.com/file/5g05eemny9tgccf/Foxit_PhantomPDF_Business.rar/file

### භාගත කරගත් මෘදුකාංගය නිවැරදිව පරිගණකයේ ස්ථාපනය කර ගමු.

බාගත කරගත් මෘදුකාංගය Unzip කර පරිගණකයට නිවැරදිව ස්ථාපනය කර එහි Patch folder එකහි ඇති File 2 Copy කර මෘදුකාංය ස්ථාපනය වු Folder එක වෙත Past කර එහි patch එක මත Click කර නිවැරදිව ස්ථාපනය කරගන්න.

නිවැරදිව ස්ථාපනය වු මෘදුකාංගය පහත පරිදි දැකගත හැක.



### PDF ගොණුවක් Open කර ගැනීම.

Open වු මෘදුකාංගයෙහි File → Open යන විධානය යටතේ ගොස් හෝ ඔබගේ PDF ගොණුව Drag කරගෙන ගොස් මෘදුකාංගය මත අතහැරීමෙන් සංස්කරණයක් සදහා ගොණුවක් විවෘත කරගත හැක.

### Open කරගත් PDF ගොනුවේ අකුර සංස්කරණය හා Object ස්ථාන වෙනස් කරීම කිරීම.

මෙම මෘදුකාංගයෙහි Edit යටතේ ඇති Edit text විධානය මගින් අකුරු සංස්කරණයද, Edit Object විධානය මගින වස්තූන් ද, Add Text හා Add Images විධාන යටතේ අකුරු හා රූප අලුතින් එක්කර ගැනීම සිදුකරගත හැක.

### PDF ගොණුවක් විවිධ ගොනුවලට Convert කිරීම

Convert යටතේ ඇති To MS Office යන විධානය යටතේ ගොස් PDF ගොණුව Ms Word, Ms Powerpoint හා Ms Excel වර්ගයේ ගොණු බවට පරිවර්තනය කර ගත හැක.

### PDF ගොණුවක් විවිධ වර්ගයේ Image වලට Convert කිරීම

Convert යටතේ ඇති To Image යන විධානය යටතේ ගොස් PDF ගොණුව png, jpg, tiff හා bmp වර්ගයේ ගොණු බවට පරිවර්තනය කර ගත හැක.

### PDF ගොණුවක පිටු ඉවත් කිරීම හා අලුතින් පිටු එක් කිරීම

Orgsnize යටතේ ඇති Insert හා Delete යන විධානය යටතේ ගොස් PDF ගොණුව තුලට නව පිටු එක් කිරීම හා ගොනුවේ ඇති පිටු ඉවත් කර ගැනීම සිදුකරගත හැක.

මේ ආකාරයෙන් මෙම මෘදුකාංගය භාවිතයෙන් අපට එදිනදා අවශ්‍ය වන PDF සංස්කරණ කටයුතු ඉතා පහසුවෙන් සිදුකරගත හැකි වන අතර මෙම මෘදුකාංගයේ ලබාදී ඇති Help යටතේ ඇති User Manual විධානය පරිශීලනයෙන් මෙහි ඇති තවත් විශේෂිත කරණු පිළිබද අධ්‍යනය කර ඒ පිළිබද දැනුමක් ලබා ගැනීමට හැකියාවක් ලැබේ.

සෙ/381615 කෝප්‍රල් ප්‍රියමාල් එච්ඩීඑම්
6 ශ්‍රීලංසිරෙ
පරිඝණක අංශය - රෙම ශ්‍රීලංසිරෙ

# නව අණදෙන නිලධාරී තනතුරු භාරගැනීම්



1 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිලධාරී ලෙස
මේජර් එච්ඊඑස්සී හේවාවසම්
ආර්එස්පි පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019.02.18 වන දින රාජකාරී ආරම්භ
කරන ලදී.



4 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිලධාරී
මේජර් ඩී ඩී පී එස් දසනායක
ආර්ඩබ්ලිව්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019.08.08 වන දින රාජකාරී ආරම්භ
කරන ලදී.



11 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිලධාරි
මේජර් ඊයුඩබ්ලිව්එන්සි ඇහැලේපොල
යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019.02.07 වන
දින රාජකාරී ආරම්භ කරන ලදී.



14 ශ්‍රීලංසිරෙ නව ඒකක
අණදෙන නිලධාරි ලෙස
ලෙුතිතන් කර්නල් එස්ඩීබී දිසානායක
ආර්ඩබ්පී යුඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ
නිලධාරි 2019.02.21 වන දින රාජකාරී
ආරම්භ කරන ලදී.

## දෙවන අණදෙන නිලධාරී තනතුරු භාරගැනීම්



4 ශ්‍රීලංසිරෙ නව ඒකක දෙවන
අණදෙන නිලධාරී ලෙස මේජර්
කේ ආර් එන් ඩබ්ලිව් බණ්ඩාර
ආර්එස්පී ආර්ඩබ්ලිව්පී යන ජ්‍යෙෂ්ඨ
නිලධාරි 2019.07.15 වන දින රාජකාරී
ආරම්භ කරන ලදී.



16 ශ්‍රීලංසිරෙ නව ඒකක
දෙවන අණදෙන නිලධාරී ලෙස
මේජර් එස්ඩබ්කේ සුභසිංහ එල්එස්සි
යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2019.02.23 වන
දින රාජකාරී ආරම්භ කරන ලදී.



11 ශ්‍රීලංසිරෙ නව ඒකක
වැ:බ දෙවන අණදෙන නිලධාරී ලෙස
මේජර් වයිඑම්ඒබි යාපා ජ්‍යෙෂ්ඨ
නිලධාරි යන 2019.07.29 වන දින
රාජකාරී ආරම්භ කරන ලදී.



17 ශ්‍රීලංසිරෙ නව ඒකක
දෙවන අණදෙන නිලධාරී ලෙස
මේජර් එම්පි හෙට්ටිආරච්චි
ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි
2019.02.25 වන දින
රාජකාරී ආරම්භ කරන ලදී.

# රෙජිමේ තනතුරු භාරගැනීම්



1 ශ්‍රීලංසිරෙ නව
රෙජිමේන්තු සැරයන් මේජර්
ලෙස බනි I කේවී ප්‍රසන්න යූඑස්පී
2019.09.04 වන දින
රාජකාරී ආරම්භ කරන ලදී.



# සිංහ කැටපත් පවුර

සිතන්න

ඔබ තරහින් සිටින විට ප්‍රතිචාර
දක්වන්න එපා....
ඔබ සතුටින් සිටින විට පොරොන්දු
දෙන්න එපා....
ඔබ දුකින් සිටින විට තීරණ
ගන්න එපා....

සෙ/379833 ලාකෝ වික්‍රමතිලක ආර්ඩීඑස්

---

මිතුරු මිතුදම

ගිම්හාන කාලයක
අහම්බෙන් වැටෙන
හිම කැටයකට වඩා
අපූරුයි අපේ මිතු දම......
පාසල් කාලයේ සිට
එකට දුව පැන
සෙල්ලම් කල හැටි
තාම මතකය මගේ හද තුල......
ඔබේ ජීවිත ගමන ගැන නුඹ
සිතා දුර ගිය දා ඉදන්
අපේ මිතුදම දුරස් වී ගියා......
අපේ මිතුදම සදා පවති
සිතනු ඇත මා සදා......

සෙ/ඊ100739 රසෙ ප්‍රේමචන්ද්‍ර ඩිජබ්ඩ්වී
3 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

---

දුප්පත් පොහොසත් භේදය

Diary එකක් නොලිව්වට දින
ගත කරපු මිනිස්සු
Whatsapp ඒවිම් නොදැම්මට
අඩන හිනාවෙන මිනිස්සු
Feelings නොදැම්මට
හැගීම් දැනෙන මිනිස්සු
Autograph නොතිබ්බට
මතකේ රැදුණු මිනිස්සු
Check in නොදැම්මට
ට්‍රැවල් කරන මිනිස්සු
I love you නොකිව්වාට
ආදරෙන් බැදුණු මිනිස්සු
හදවත නතර නොවුනට
මැරි මැරි ජීවත් වෙන මිනිස්සු
ඕන තරම් ඇති.

---

අපේ කම

හෙල බස වියකිලා සිහසුන් වැනසේද
දිනයක අම්මා කියන්නට කට නොඇරේද
උන්ගේ ලෙයින් සිංහල කම වියකේද
යරලව සහල අං එදිනට පරලොව යාද

සෙ/381297 රසෙ රණතුංග ආර්එම්කේ
6 ශ්‍රීලංසිරෙ

## Best joke

A Chinese walk s into a bar in America late one Night and he saw Steven Spielberg.
As he was a great fan of his movies, he rushes Over to him, and asks for his autograph.
Instead, Spielberg gives him a slap and says, “You Chinese people bombed our pearl harbor, Get outta here”
The astonished Chinese man replied, “It was not The Chinese who bombed your pearl harbor, it Was the Japanese, Taiwanese, you’re all the Same “replied Spielberg.
In retun, the Chinese gives Spielberg a slap and Says, “You sank the titanic, my forefathers were on that Ship.
Shocked, Spielberg replies, “It was the iceberg That sank the ship, not me”
The Chinese replies, “Iceberg Spielberg, Carlsberg you’re all the same”

කෙනි/85057 2/ලුතිතන් චන්ඩි රාජපක්ෂ
6 ශ්‍රීලංසිරෙ

## විජයග්‍රහණයෙන් දසවසරකට පසු

ලෝ දෙනෙත් අද අඳ වෙලා......
ලෝ දෙතොල් අද  ගොළු වෙලා......
රණ ගීත ගැයූ රටේ
විරහ බයිලා ගීත රජවෙලා......
සුදු වතින් සැරසිච්ච
බෝ මලුව තනි වෙලා......
පරවියන් ඉගිලුනත්
නිදහසේ සැරිසරා
බිව් කිරට ණය නැති
ජාතියම ණය ගැති......
දෑත් පා අහිමි වූ
බෝ සතුන් අද තනි වෙලා......

සෙ/382926 ලාකෝ විතාන එස්ඩි - 6 ශ්‍රිලංසිරෙ

ගෙදර  බුදුන් ලෙඩ වුණු දා.....
පලා කොල මැල්ලුම
කොස් දෙල් පොලොස් මාළුව
ලිප උඩට කාලෙකින්
නැවිදින්.....
හිරුට කලියෙන්
ලිපට පණදුන්
අපේ අම්මාට බැරිවු දා පටන්
පොල් අතු රටාවට
අතුගෑව ගෙයි මිදුල
සුදු වැල්ල නැ
මුණ සෝදා.....
මල් අතු මලින් පිරි
පෙරදා වාගේ නැති
ගේ අගුවේ මල්
සුවද පිරිලා.....

සෙ/381614 ලාකෝ ප්‍රනාන්දු කේවීආර්බි
6 ශ්‍රිලංසිරෙ

## Nature

The leaves in the water
Sit almost perfectly still
With each coarse ripple
They tremble and shake
Inching closer to the shore
And our gently rustling boat

O/70857    Lt  AMBPB Abayakoon
24SLSR

## පුහුණු බිම

''උස්මිටි කම් මදි පොඩි කම්
සිතුවිලි සිහින නොදැනෙන්න වුණා
තරග, පීඩනය, බලයට, ජවයට අපි හුරු කෙරුවා
අවි ආයුධ යුද ගිණිදැල් අප සිත් රජ කෙරුවා
නිහඬ නිසොල්මන් ගොම්මන් රැය පහන් වුණා
පුහුණු බිමේ අපි රුධිරය නොව දහඩිය හෙලුවා
රට දැය වෙනුවෙන් දිවිදුන් සොයුරු සෙබලුනේ
නුඹේ අග හිගකම මකන්න අපි පුහුණුව ලැබුවා
පුහුණුව ශක්තිය ධෛර්යය
අප සෙබලුන් කෙරුවා
තරගය දිනුම් අපි සොල්දාදුවන් වුණා''

සෙ/382518 ලාකෝ කුමාර එම්ඩබ්පි

උපන් බිම රැකි පුතුන් වෙනුවෙන්

| | |
|---|---|
| ජයගත් පසුව තිස් වසරක් තිබු | යුද්දේ |
| අපමන සහනයකි සිරිලක් මව | ලද්දේ |
| යන්නට පෙරට යලි එඩිතර කම | මැද්දේ |
| සෙත්මල් ඉසිමි හැමටම නව | අවුරුද්දේ |
| වද වේදනා දුක වස් ගණනක් | දැරුවා |
| ඉන්පසු පරදවා යුධ පිටියෙහි | මරුවා |
| ලක් මව යලිත් සංහිදියා රස | ඉරුවා |
| මේ හැම දේටම මුල සුරැ විරු රණ | විරුවා |
| ජල ගැල්මකදි නියගයදි රුදු | ගැටුමකදි |
| නොතකා දිවා රැ ඇවිත් ඉදිරියට | ඇදි |
| රණවිරු මෙහෙය සිදුවන දෑතකට | ලැදි |
| මෙතෙකැයි කියා පවසන්නට වචන | මදි |
| රැදුනත් ගිනි අවිය රුදු සටනකදි | අත |
| නිතිය විනය මිනිසත්කම පිරුණු | හිත |
| සිවු දිග ගලා යන රණවිරු මෙහෙය | මත |
| මෙතුවක් යෙදි ඇත පොදුජන මගට | සෙත |
| නිවහල් හැගුම් අදිනට අහිමන | ඔසුසේ |
| නොනැවති ආ ගමන ආසිරි මල් | වැස්සේ |
| රණ විරුවන් නොමැත කිසිදින පසු | බැස්සේ |
| තව දිරියට යනු මැන දිය දද | ඉස්සේ |
| ගහකොළ සතා පුබුදන රිවි සදු | කිරණයි |
| විහිදෙන සොබා සිරි මේ අප දිනු | දරණයි |
| ගෙන දුන් දැට සුව සහනෙයි | රැකවරණයි |
| රණවිරුවාට නව වස දළදා | සරණයි |

සෙ/ 384678 රසෙ අබේකෝන් ඒඑම්ආර්ආර්ටි
7 ශ්‍රිලංසිරෙ

පාසැල් මිතුර.....

හිරු දැක කතරෙ ගිනි දැල් අතරින්
ගොළුබෙලි ගමනක් අපි යනවා.....
සිතුම් පැතුම් පොදි සේද වළාවන්
විලසින් ඈතට පා වෙනවා.....

ඉමක් කොනක් නැති මේ බව කතරෙ
කෙදිනක හෝ අප වෙන් වෙනවා.....
යහමග සොයමින් ඔබ යන ගමනට
සුහද පැතුම් මගේ එක් වෙනවා.....

සෙ/376452 රසෙ සේනානායක එස්එම්එස්එන්
බළඇණි මුලස්ථානය - 14 ශ්‍රිලංසිරෙ

සියල්ල මුදලට ලබාගත හැකිද?

ඔබට......
නිවසක් මිලදීගත හැකි නමුත්
පවුලක් මිලදීගත නොහැක......
ඇදක් මිලදීගත හැකි නමුත්
නින්ද මිලදී ගත නොහැක......
පොතක් මිලදී ගත හැකි නමුත්
දැනුම මිලදීගත නොහැක......
ඔරලෝසුවක් මිලදීගත හැකි නමුත්
කාලය මිලදීගත නොහැක......
තනතුරු මිලදීගත හැකි වුවද
ගෞරවය මිලදීගත නොහැක......
ඖෂධ මිලදීගත හැකි නමුත්
නිරෝගීකම මිලදීගත නොහැකී
විවාහය මිලදීගත හැකි නමුත්
ආදරය මිලදීගත නොහැක......
ආරක්ෂාව මිලදීගත හැකි නමුත්
රැකවරණය මිලදීගත නොහැකී
(පොතපත ඇසුරිනි)
සෙ/373399 කෝප්‍රල් බංඩාර එස්ඒපිකේ
6 ශ්‍රිලංසිරෙ

ජිවිතය

ජිවිතය නැමැති මල් උයනේ
පරවි නොයන ඒකම පුෂ්පය
ආත්ම විශ්වාසය බවත්.....
අප ලග ඉන්නා හොදම සහොදරයා
තමාගේ සිත බවත්
අමතක නොකරන්න
මිනිසෙකු දැඩි සේ වෙහෙස මහන්සි වන්නේ
තම ජිවිතය අලෝකමත් කර ගැනිමටය.....
නමුදු අන්දකාරය නැමැති පදික වෙදිකාවෙන්
එලිය නැමැති පහණ විහිදුවා ගත හැක්කේ
අවංක මිනිසෙකුට පමණි.....

සෙ/384682 රසෙ දසනායක එස්ඩීඩීඑම්
7 ශ්‍රිලංසිරෙ

ගුරු මව
ඇත දේශවල කාථ මැවු
දෛවයට පෙර හුරු ගැන්වු
දහමෙන් මුල් පිටු රසවත් කල
දැනුමෙන් මගේ ලොව එළිය කල
ජිවන ගසේ ආදර මුදුන් මල
තෙරුවන් සරණයි ඔබට ගුරු මව

සෙ/381561 ලාකෝ දිසානායක ඩීඑම්ටීඑස්කේ
24 ශ්‍රිලංසිරෙ

# උපන්දින සුභ පැතුම්



සමාධි හිරන්යා හේවාවසම් 2019.11.04 වන දින දහවන උපන්දිනය සැමරූ වැඩිමහල් දියණියටත් බිහිනි හර්ෂිකා හේවාවසම් 2019.10.03 වන දින පස්වන උපන්දිනය සැමරූ බාල දියණියටත් නිදුක්නිරෝගී වාසනාවන්ත යහපත් අනාගතයකට ආසිරි පතන්නේ මේජර් එච්ආර්එස්සී හේවාවසම් ආර්එස්පි පිඑස්සි පියාණන් සහ රසිකා කෞෂලී වර්ණකුලසූරිය ආදරණීය මෑණියන් යන දෙපලයි.



සවිද්‍ය රන්සර විරසිංහ 2019.08.11 වන දින සිව්වන උපන්දිනය සැමරූ සිය ආදරණීය සුරතල් සිගිති පුතුට නිදුක් නිරෝගී වාසනාවන්ත යහපත් අනාගතයකට ආසිරි පතන්නේ සෙ/370302 කෝප්‍රල් විරසිංහ එච්පිඩි පියාණන් සහ ඩබ්ලිව් පි සුරංගා සජීවනී ගුණවර්ධන ආදරණීය මෑණියන් යන දෙපලයි.



විෂිනි සෙයන්සා 2019.07.06 වන දින හත්වන උපන්දිනය සැමරූ සිය ආදරණීය දියණියට නිදුක් නිරෝගී වාසනාවන්ත යහපත් අනාගතයකට ආසිරි පතන්නේ සෙ/372878 ලාකෝ ප්‍රියංකර කේපිඑස් පියාණන් සහ ඩබ්ලිව් ගනේෂා මාධවි ආදරණීය මෑණියන් යන දෙපලයි.



මිනුලි සෙහන්සා අබේවික්‍රම 2019.06.26 දින පළමු උපන්දිනය සැමරූ සිය ආදරණීය සුරතල් සිගිති දියණියට නිදුක් නිරෝගී වාසනාවන්ත යහපත් අනාගතයකට හදපිරි සෙනෙහසින් යුතුව ආසිරි පතන පියා සෙ/381544 රසෙ අබේවික්‍රම පීජියුපී හා මව අයේෂා මදුෂානි.



චාරුත ජනිදු දිසානායක 2019.09.28 වන දින දොලොස්වන උපන්දිනය සැමරූ වැඩිමහල් පුතුටත් සෙනුජි දිසස්නා දිසානායක 2019.08.22 වන දින පස්වන උපන්දිනය සැමරූ දියණියටත් පැහැබර අනාගතයකට හද පතුලෙන්ම සුභාශිංසන ගෙනෙන්නේ ආදරණිය පියාණන් සහ කෝප්‍රල් වික්‍රමසිංහ ඩබ්ඩබ්ඒඑම්එම් මෑණියන් යන දෙපලයි.



විනු විමංසා නෙත්දිනි 2019.07.18 වන දින පළමු උපන්දිනය සැමරූ සිය ආදරණීය සුරතල් සිගිති දියණියට නිදුක් නිරෝගී වාසනාවන්ත යහපත් අනාගතයකට හදපිරි සෙනෙහසින් යුතුව ආසිරි පතන පියා සෙ/368576 බනි 11 දයානන්ද කේජිඅයිඑස්කේ හා මව අකිලා දිල්රුක්ෂි.

## යුගදිවියට සුබ පැතුම්



2019 අගෝස්තු 15 වන දින 8 ශ්‍රීලංසිරෙ ඒකකයේ (නි/69591) කපිතන් ඩී වී ඒ ධනුෂ්ක නිලධාරී ගයානි ලක්මාලි අතපත්තු මෙනවිය සමගින් යුග දිවියට එළඹෙන ලදී.



2019 අගෝස්තු 08 වන දින 8 ශ්‍රීලංසිරෙ ඒකකයේ (නි/70011) කපිතන් එච් වී අමරසිංහ නිලධාරී වාසනා රන්මිණි මෙනවිය සමගින් යුග දිවියට එළඹෙන ලදී.



නව විවාහ යුගයට පා තැබූ කපිතන් කොඩිසිංහ හා නෙළුම් 2019 අගෝස්තු මස 08 වන දිනට යෙදී තිබූ සුබ මොහොතින් යුගදිවි ගමන් අරඹන ලදී



සෙ/377024 ලා/කෝ ආරියරත්න ඩබ්ලිව්ඩීඑස්එන් යන කොනොනිගේ විවාහ මංගල්‍ය ඡායාරූපය



සෙ/380723 ලා/කෝ ප්‍රනාන්දු ඩබ්ලිව්කේඑන්සී යන කොනොනිගේ විවාහ මංගල්‍ය ඡායාරූපය


ප්‍රකාශනය
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

උපදේශකත්වය

උපදේශකත්වය

ප්‍රධාන සංස්කාරක

සහය සංස්කාරක

සෝදුපත් කියවීම

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම

ලිපිනය

රෙජිමේන්තු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
යුද්ධ හමුදා කඳවුර අඹේපුස්ස